

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

වාර්ෂික වාර්තාව 2023/24

දැක්ම

“එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පොස්පරස් පෝෂක මඟින් අපගේ මාතෘභූමියේ සාරවත් පසක් නිර්මාණය කිරීම”



මෙහෙවර

“පරිසර හිතකාමී සහ නව ක්‍රියාවලියක් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරාලීම"

පටුන

- හැඳින්වීම 01
- අධ්‍යක්ෂක මණ්ඩලය 02
- කළමනාකරණ කණ්ඩායම 03-04
- සභාපතිතුමාගේ ප්‍රකාශය 05-06
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 07-9
- මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2023/24 10-13
- මූල්‍යමය ප්‍රමුඛතා 14
- ආයතනික ව්‍යුහය 15
- අනුමත කාර්ය මණ්ඩලය 16
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 17
- විගණකවරුන්ගේ වාර්තාව 18 – 24
- මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 25
  - 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 26
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 27
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 28
  - මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 29-44
  - ආයතනික තොරතුරු, සැළකිය යුතු ගිණුම්කරණය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන 45-53
- රැස්වීම් වාරය දැනුම්දීම 54
- පෙරකලාසියේ ආකෘතිය 55

හැඳින්වීම

සමාගමේ නම
සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (PB 308)

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය
සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය
බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ජී.ඒ.එම්.එස්.පී.අබන්වෙල මහත්මිය	-	සභාපති
ජී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය	-	අධ්‍යක්ෂ
එල්.ඒ.එස්. ලියනාරච්චි මහතා	-	අධ්‍යක්ෂ
කේ.ඩී.එස්.අබේපාල මහතා	-	අධ්‍යක්ෂ
ඩී.එම්.බී.ජී.ජයතිලක මහතා	-	අධ්‍යක්ෂ
එල්.එන්.පී. පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ

සමාගමේ ලේකම්
කල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විස් (පුද්ගලික) සමාගම,
අංක 06, බලහේනමුල්ල පාර, කොළඹ 06.

අවසාන මව් සමාගම
ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් පිළිබඳව සම්පූර්ණ අයිතිය ඇත.

රේඛීය අමාත්‍යාංශය
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,
තැ.පෙ : 570, නො : 73/01, ගාලුපාර, කොළඹ 03

ලියාපදිංචි කාර්යාලය
අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 0112459906/7
ෆැක්ස් අංකය - 0112459908

විගණකවරු
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
නො : 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

බදු උපදේශකවරු
අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12, රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අධ්‍යක්ෂක මණ්ඩලය



පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල මහත්මිය

සභාපති



පී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය

අධ්‍යක්ෂ



එල්.ඒ.එස්. ලියනාරච්චි මහතා

අධ්‍යක්ෂ



කේ.ඩී.එස්.අබේපාල මහතා

අධ්‍යක්ෂ



එල්.එන්.පී.පෙරේරා මහතා

අධ්‍යක්ෂ



ඩී.එම්.බී.පී.ජයතිලක මහතා

අධ්‍යක්ෂ

කළමනාකරණ කණ්ඩායම



යූ.ඒ.දයානන්ද මහතා
සාමාන්‍යාධිකාරී



ආර්.එම්.පී. කරුණාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ඩී. පී. යූ. චාමර මහතා
මූල්‍ය කළමනාකරු



එස්.ඩී. රූපසිංහ මහතා
මෙහෙයුම් කළමනාකරු



එම්.එම්.ඩී. තිලකරත්න මහතා
මානව සම්පත් කළමනාකරු



කපිතාන් කේ.පී.ආර්.පී. කිරිඇල්ල මහතා
ආරක්ෂක කළමනාකරු



ඩී. ආර්.කේ. තිලකරත්න මහතා
ගණකාධිකාරී



ආර්. ඒ. ඒ. පී. රණසිංහ මහතා
අලෙවි විධායක



ඩී.බී. කීරියාවත්ත මහතා
අභ්‍යන්තර විගණක



එල්.එල්.ඩී.අයි. පැතුම් මහතා
නිෂ්පාදන ඉන්ජිනේරු



ඒ.එම්.සනත් බණ්ඩාර මහතා
යාන්ත්‍රික ඉංජිනේරු



එස්.එස්.එස්. සේනාරත්න මහතා
සහකාර අලෙවි කළමණාකරු



එස්. ඒ. අබේසිරි මහතා
සැපයුම් නිළධාරී



එම්.ඒ.ආර්.කේ. මංචනායක මහතා
කාර්ය මණ්ඩල නිළධාරී
(පරිපාලන හා මානව සම්පත්)



ඩී.ආර්. ගුණරත්න මහතා
කම්හල් නිළධාරී



ඩී.එස්.එම්. දිසානායක මහතා
ගබඩා නිළධාරී



ඩී.එස්.සී.කේ. දෙහිවත්ත මහතා
පර්යේෂණ හා සංවර්ධන නිළධාරී

සභාපතිවරයාගේ ප්‍රකාශය

පොස්පේට් පාෂාණය කෘෂිකර්මාන්තයට හා අනෙකුත් කර්මාන්තවලට උපයෝගී කරගන්නා බොහෝ ප්‍රයෝජන ඇති වැදගත් ඛනිජ ප්‍රභවයකි. ශාක වැඩීමට හා ප්‍රවර්ධනයට පොස්පේට් ඉතා අත්‍යාවශ්‍ය පෝෂකයකි. ගෝලීය පොස්පේට් පරිභෝජනය පොහොර නිෂ්පාදනයේ සිට සේදුම්කාරක නිෂ්පාදන කර්මාන්තය, පිඟන් කර්මාන්තය හා වෙනත් කර්මාන්ත විශාල ගණනකට අදාළ වේ. ලෝක වෙළඳපොළ තුළ රොක් පොස්පේට් වඩාත් ස්වාභාවික හා තිරසාර බැවින් රසායනික පොස්පේට්, පොහොර සඳහා කාබනික අදේශකයක් ලෙස පිළිගනු ලැබේ.

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එමනිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% - 40% ක පමණ P_2O_5 ඛණිජ අඩංගුවේ. 1971 දී එප්පාවල පොස්පේට් නිධිය සොයාගත් අතර, එය පොස්පේට් මෙ.ටො. මිලියන 60ක සංචිතයකි. ශ්‍රී ලංකාවේ දේශීය පොස්පේට් පොහොර අවශ්‍යතාවය සපුරාලීමට ලංකා පොස්පේට් සමාගම රොක් පොස්පේට් පොහොර නිපදවීම සිදුකරයි. වර්තමාන ධාරිතාව අනුව ලංකා පොස්පේට් සමාගම දේශීය අවශ්‍යතාවය සඳහා එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො 50,000ක් පමණ වාර්ෂිකව නිපදවන අතර, එය පුද්ගලික හා රාජ්‍ය පොහොර සමාගම් හරහා ගොවියන් වෙත බෙදාහරී.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක්පොස්පේට් (ERP) සහ අධි - ශ්‍රේණියේ එප්පාවල රොක්පොස්පේට් (HERP) යනුවෙන් රොක්පොස්පේට් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජූලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැෆයිට් සමාගමෙන් වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුව ලංකා පොස්පේට් සමාගමට මෙරට පොහොර නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රමුඛ හා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවේ.

පසුගිය වසරේ ලබා ගත් **දළ** පිරිවැටුම **වූ රුපියල් මිලියන** 546 හා සසඳන විට 2023/24 මූල්‍ය වර්ෂය තුළ **ලබා ගත්** රුපියල් මිලියන 1080 **දළ පිරිවැටුම** සැලකිය යුතු දියුණුවකි. **විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් පාරිභෝගිකයන් සඳහා ඉහළ ශ්‍රේණියේ රොක් පොස්පේට් සැපයීමේ හැකියාව** නිසා **පිරිවැටුමේ මෙතරම් වධර්නයක් ඇති කර තිබේ. ඒ සමගම සමාගම පසුගිය** වර්ෂය තුළ **රු. මිලියන** 39.8 **(**නැවත ප්‍රකාශිත**) මෙහෙයුම් පාඩුවන්** ලබා **තිබියදීත්** මෙම වර්ෂය තුළ **රු.** 239.6 ක **මෙහෙයුම් ලාභයක්** වාර්තා කිරීමට මෙම **වසරේ පිරිවැටුම 97%** කින් **වැඩි වීම. කැපී පෙනෙන** ලෙස **උපකාරී විය.** ඒ අනුව, සමාගමේ සමස්ථා කාර්යසාධනය ඉහළ යාම හේතුවෙන් ලංකා පොස්පේට් සමාගමට රු.මිලියන 363.3 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට හැකි විය.


එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ත කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග නිපදවීම ජාතික අවශ්‍යතාවයක් සහ වැදගත්කමක් ලෙස අප හඳුනාගෙන තිබේ. එමනිසා, සමාගමේ මීළඟ ක්ෂණික අවශ්‍යතාවය ලෙස SSP, දේශීයව හඳුන්වාදීමේ මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.
එමෙන්ම ඍජු හෝ වක්‍ර අපනයනකරුවෙකු ලෙස ජාත්‍යන්තර වෙළඳපොළට රොක් පොස්පේට් අපනයනය කිරීමේ ක්‍රියාවලිය විදිමත් කිරීමට කළමණාකාරීත්වය කටයුතු කරමින් සිටී.

වගකිව යුතු රාජ්‍ය සමාගමක් ලෙස, රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාකරන අතර සුදුසුකම් ලත් නිළධාරීන් සහ ප්‍රමිතිගත උපකරණ සමඟ ක්‍රියාවලීන් සහ යටිතල පහසුකම් හඳුන්වා දෙමින් ලංකා පොස්පේට් සමාගම ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගනිමින් සිටී.

තවද, මානව හිතවාදී සේවා පරිසරයක් සහ සෑම තරාතිරකම සේවකයන් සඳහා ඔවුන්ට අදාළ ක්ෂේත්‍රවල නව වර්ධනයක් ඇති කිරීමට කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් හඳුන්වා දීමට ද පියවර ගෙන ඇත.

අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් අප වෙත මඟ පෙන්වීම, ධෛර්‍යය, සහයෝගය හා දේශපාලන නායකත්වය ලබාදෙන කර්මාන්ත අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.



පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල
සභාපති
ලංකා පොස්පේට් සමාගම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ 2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

1.0 සමාගමේ නම

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා බණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබීය.

3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික කෘෂිකාර්මික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීමයි.

4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී.

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරීව නිගමන හා තක්සේරුකිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි. සමාගමේ අධ්‍යක්ෂකවරු විසින්

වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහඅනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණුදෙනුවේ ස්වභාවය සහ හරය මනාව පිළිඹිබු වන පරිදි එයට අදාළ විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය සැළකිලිමත් විය.

6.0 දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ ගණනය කිරීම් සඳහා ක්ෂයවීම්

වසර සඳහා දේපල, පිරියත සහ උපකරණ සඳහා ආයෝජනය රුපියල් 8,260,285.00 කි. රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මිලදී ගත් උපකරණවල පිරිවැය එයට ඇතුලත් වන අතර ඒවා ප්‍රමාණයෙන් සැලකිය යුතුය.

දේපළ, පිරියත හා උපකරණවල තත්ත්වය හා චලනයන්, ඒවායේ තක්සේරු කිරීම සහ ක්ෂය වීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 5.0 හි දක්ව ඇත.

7.0 බදුකරණය

වසර සඳහා ව්‍යාපාර ආදායම සහ අනෙකුත් ආදායම් සඳහා සමාගමට 30% ක බදු වගකීමක් ඇත. 2024.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා පොස්පේට් සමාගම එහි පිරිවැටුම මත වැට් බද්ද ගෙවීමට බැඳී සිටියේ ය. මක්නිසාදයත්, එම දිනයේ සිට වැට් බදු නිදහස් කිරීමේ ලේඛනයට ඇතුලත් කර තිබුනේ ජෙව පොහොර පමණි. මූල්‍ය වර්ෂයේ අවසාන කාර්තුව සඳහා සම්පූර්ණ වැට් බදු ගෙවීම රුපියල් මිලියන 32කි.

8.0 ලාභාංශ

2022/23 වසර සඳහා රුපියල් මිලියන 200 ලාභාංශ ගෙවා ඇති අතර, සමාලෝචන වර්ෂය සඳහා රුපියල් මිලියන 75.0ක් අතුරු ලාභාංශ ලෙස ගෙවා ඇත.

9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/-, සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමලෝචනයට භාජනය කරන වසර ඇතුලත ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

10.0 කොටස් හිමිකාරීත්වය

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ 2(3) වගන්තියට අනුව එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (නිල වශයෙන්) භාණ්ඩාගාරික ලේකම්ය.

2024 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ.

භාණ්ඩාගාර ලේකම්ට (නිල වශයෙන්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරීත්වය දරයි. (එකක් රු.10/- බැගින්)

මෙහි හිමිකාරීත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

11.0 කොටස් හිමිකාරීත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරීත්වයේ කිසිදු වෙනස්වීමක් 2024 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමාලෝචනයට භාජනය වූ වසර තුල පුණ්‍ය කටයුතු සහ ආයතනික සමාජ වගකීම් සඳහා සමාගම විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දී නොමැත.

13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 409,335,027.00/- වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 299ක් වේ.

14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරීය.

පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල මහත්මිය	- සභාපති
පී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය	- අධ්‍යක්ෂ
එල්.ඒ.එස්. ලියනාරච්චි මහතා	- අධ්‍යක්ෂ
කේ.ඩී.එස්.අබේපාල මහතා	- අධ්‍යක්ෂ
ඩී.එම්.බී.පී.ජයතිලක මහතා	- අධ්‍යක්ෂ
එල්.එන්.පී.පෙරේරා මහතා	- අධ්‍යක්ෂ

15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

ආචාර්ය එස්.එච්.පී. මංජුල - අධ්‍යක්ෂ (24.01.2024) වසර තුළ ඉල්ලා අස් වූ අතර, එල්.ඒ.එස්. ලියනාරච්චි මහතා - අධ්‍යක්ෂ (24.01.2024) 2023/24 වර්ෂය තුළ අලුතින් පත් කරන ලදි.

16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ වියදම

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 4,632,199/- ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම වශයෙන් ගෙවා ඇත.

17.0 <u>ව්‍යවස්ථාපිත ගෙවීම්</u>

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

18.0 <u>අනුකූලවීම</u>

සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති හෝ රෙගුලාසිවලට පටහැනි ක්‍රියාකාරකම්වල නිරතවී නොමැත.

19.0 <u>අඛණ්ඩ පැවැත්ම</u>

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිලියෙල කර ඇත. ඒ පිළිබඳ හෙළිදරව්වක් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ දක්වා ඇත.

20.0 <u>සංස්ථාපිත පාලනය</u>

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්කරුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

21.0 <u>අවදානම් කළමනාකරණය</u>

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇත.

22.0 <u>විගණකයින්</u>

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපති කටයුතු කරයි.

විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට වන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ 2023/24 වර්ෂය සඳහා සමාගම විසින් වෙන්කරන ලද මුළු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 273,655/- ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:

සභාපති

G.W. MADUSHA UDANI FONSEKA
Director


අධ්‍යක්ෂක

මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2023/24


01. පිරිවැටුම/ආදායම

2022/2023 වර්ෂයේ රුපියල් මිලියන 546.1 හා සසඳන විට 2023/2024 වර්ෂයේ සමාගම මිලියන 1,080 පිරිවැටුමක් වාර්තා කර ඇත. මෙය ප්‍රමාණයෙන් 60% කින් සහ වටිනාකමින් 97% කටත් වඩා කැපී පෙනෙන වර්ධනයකි. ඉහළ ශ්‍රේණියේ රොක් පොස්පේට් සඳහා ඇති ඉල්ලුම (P205 28% වැඩි) වර්ෂය තුළ ඉහල පිරිවැටුමක් වාර්තා කිරීමට හේතු විය.

ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)




වටිනාකම (රුපියල් මිලියන)



02. ලාභය


මෙහෙයුම් ලාභය

2023/2024 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ලාභය රු.මිලියන 239.58 කි. එය ගිය වසරේ වාර්තා වූ මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 39.85 (නැවත ප්‍රකාශිත) හා සළකා බලද්දී, වාර්තා වූ කැපී පෙනෙන ජයග්‍රහණයක් වන අතර ඉහළ ශ්‍රේණියේ පොස්පේට්හි ඉහළ ලාභ ආන්තිකය ඉහත ප්‍රතිඵල තීරණය කර ඇත.




බදුවලට පෙර ලාභය (PBT)

2022/23 වසරේ දුර්වල කාර්ය සාධනය තිබියදීත්, 2023/2024 සමාගම බදු පෙර ලාභය රුපියල් මිලියන 363.35 වාර්තා කිරීම, වාර්තාගත ජයග්‍රහණයකි.




03. ශුද්ධ වත්කම - (කොටස්කරුවන්ගේ අරමුදල්)

එසුගිය වසරට වඩා ශුද්ධ වත්කමෙහි තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර එය 2023/24 වසර අවසානයේ රුපියල් මිලියන 1.06 ලෙස වාර්තා කොට ඇත.



04. මුළු වත්කම

වර්ෂය තුළ මුළු වත්කමෙහි වටිනාකම රුපියල් මිලියන 1.310 සිට මිලියන 1.469 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වසර තුළ ස්ථාවර තැන්පතු සහ මුදල් හා මුදල් සමාන දෑ ඉහළ යාමයි .



ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය

I. සුදුසුකම් ලත් නිළධාරීන් සම්බන්ධ කර ගනිමින් සහ ප්‍රමිතිගත උපකරණ ලබා දීමෙන් නියැදි පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදි. ජාතික සහ ජාත්‍යන්තර සහතික කිරීමේ මට්ටම (රසායනාගාර නිරීක්ෂණය) ආරම්භ කර ඇති අතර 2024/2025 වසර තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

II. සූර්ය බලශක්ති උත්පාදනය සඳහා එප්පාවල කර්මාන්ත ශාලාවේ වහලය කුලියට දීම දැනටමත් අවසන් කර ඇති අතර ඉදිරියේ දී මසකට මිලියන 1 ක අමතර ආදායමක් උපයා ගැනීමට බලාපොරොත්තු වේ.

III. භාවිතා **නොවන ක්‍රෂර් යන්ත්‍රය භාවිතා කිරීම සඳහා මෙහෙයුම් සැලැස්ම සකස් කර ඇති අතර** 2024/2025 **වෂර්යේ සිට සමාගමේ නිත්‍ය මෙහෙයුම් සඳහා එය එක් කිරීමට අපේක්ෂා කෙරේ.**

IV. **නිමි** භාණ්ඩ ගබඩා වහල **පුළුල් කිරීම** දැනටමත් අවසන් කර ඇති අතර, **එය** වැසි දිනවල බාධාවකින් තොරව **පැටවීමේ** ධාරිතාව වැඩි කිරීමට හේතුවී ඇත.

V. **පතල් කැණීම සඳහා කුලියට ගත් වාහන වෙනුවට,** ලංකා පොස්පේට් සමාගමේ අයිතිය යටතට **ගැනීමට පියවර ගෙන** තිබේ.

සාමාන්‍යාධිකාරී

මූල්‍ය ප්‍රමුඛතා කිරීම්

වර්ෂය සඳහා

(Rs. '000)

	2023/24	2022/23	2021/22	2020/21	2019/20
ආදායම	1,080,039	546,100	741,553	750,374	510,004
බදුවලට පෙර ලාභය / (අලාභය)	363,349	69,334	157,030	150,582	13,480
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	239,415	44,037	122,783	124,017	5,489
මුළු විස්තීර්ණ ආදායම	243,662	15,977	147,631	117,494	18,821

වර්ෂ අවසාන දිනට

	2023/24	2022/23	2021/22	2020/21	2019/20
කොටස්හිමියන්ගේ අරමුදල්	1,055,404	1,011,742	1,068,519	950,888	831,378
කාරක ප්‍රාග්ධනය	894,396	806,854	798,299	685,183	528,312
මුළු වත්කම්	1,468,740	1,310,280	1,184,905	1,099,694	948,648
කාර්ය මණ්ඩල පිරිවැය	409,335	320,410	351,356	325,078	303,310
සේවක සංඛ්‍යාව **(ගණන)**	299	315	336	325	333


කොටසකට

	2023/24	2022/23	2021/22	2020/21	2019/20
ඉපැයීම් **(රුපියල්)**	33.02	6.07	16.93	17.10	0.76

අනුපාතයන්

	2023/24	2022/23	2021/22	2020/21	2019/20
දළ ලාභ අනුපාතය	50.6%	37.8%	46.8%	46%	37%
බදු පෙර ලාභ අනුපාතය	33.6%	12.7%	21.2%	20.1%	2.6%
ජංගම අනුපාතය **(වාර)**	3.76	4.76	13.97	10.70	14.56
කොටස්හිමියන්ගේ අරමුදලට ප්‍රතිලාභ **(%)**	22.68%	4.35%	11.49%	13.04%	0.66%

ආයතනික ව්‍යුහය



අනුමත කාර්ය මණ්ඩලය

කාණ්ඩය	වැටුප් කේතය	තනතුර	තනතුරු ගණන
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM - 2-1	සාමාන්‍යාධිකාරී	01
	HM - 1-3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන	01
		නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නොවන	01
	HM - 1-1	මූල්‍ය කළමනාකරු	01
		නිෂ්පාදන කළමනාකරු	01
		මෙහෙයුම් කළමනාකරු	01
		පරිපාලන හා මානව සම්පත් කළමනාකරු	01
මධ්‍යම/මැදපෙළ කළමනාකරු	MM - 1-1	ගණකාධිකාරී	01
		යාන්ත්‍රික ඉන්ජිනේරු	01
		නිෂ්පාදන ඉන්ජිනේරු	01
		අභ්‍යන්තර විගණක	01
		සහකාර සැපයුම් කළමනාකරු	01
		සහකාර අලෙවි කළමනාකරු	01
		ආරක්ෂක කළමනාකරු	01
කනිෂ්ඨ කළමනාකරු	JM - 1 – 1	සැපයුම් නිළධාරී	01
		පරිපාලන නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)	01
		කම්හල් නිළධාරී	01
		ගබඩා නිළධාරී	01
		පර්යේෂණ හා සංවර්ධන නිළධාරී	01
කළමනාකාර සහායක	MA 2-1		28
	MA 1-1		30
ප්‍රාථමික මට්ටම	PL - 3		73
	PL - 2		80
	PL - 1		120
මුළු ගණන			**350**

විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

සංයුතිය

විගණන සහ කළමනාකරණ කමිටුව යනු, අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියන අනු කමිටුවකි. කමිටුවේ සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයා වන අතර, තවත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු කමිටුවේ අනිකුත් සාමාජිකයන් වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරියෙකු සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයින් ලෙස කමිටුව නියෝජනය කරයි.

රැස්වීම්

විගණන සහ කළමනාකරණ කමිටුව 2023/2024 වසර තුළ සිව් වතාවක් රැස්වීමට හැකිවිය. සමාගමේ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් මෙන්ම බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තා සහ පවතින පාලනවල කාර්‍යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇගයීමට ලක්කරන ලදී.

නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙහෙයුම් පාලන විධි හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඉස්මතු වී ඇති ගැටළු නිවැරදි කිරීම සඳහා කළමනාකාරිත්වයට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද තීරණාත්මක කරුණු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.

G.W. MADUSHA UDANI FONSEKA
Director

සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
සී/ස ලංකා පොස්පේට් සමාගම

විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අවිඛබලිවපක/ඔ/ලල්සිපල්/1/23
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 ඔක්තෝම්බර් 16 දින

සභාපති,

ලංකා පොස්පේට් ලිමිටඩ්.

ලංකා පොස්පේට් ලිමිටඩ්හි 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාංගණනය කළ මණය

ලංකා පොස්පේට් ලිමිටඩ්හි ("සමාගම") 2024 මාර්තු 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ගිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යටා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාංගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නන්න්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඇඹරුම් යන්ත්‍ර සඳහා 2022 වර්ෂයේ රු.15,816,482 ක වටිනාකමකට ආනයනය කළ රබර් ස්ලිප් එම වර්ෂයේදීම ලැබුණද සාමාන්‍ය තොග ගිණුමට හර නොකර අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී මිලදී ගත් ඇඹරුම් යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය අත්තිවාරම සකස් කිරීම සඳහා ගෙවන ලද රු.3,450,000 ක මුදල සමාලෝචිත වර්ෂය වන විටත් යල් පැනගිය තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.
මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගමේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාෂප ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, සමූහය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

සමාගම විසින් ඛනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකකයක් රු.350 ක් බැගින් දේශීයව මිලදී ගෙන විගණිත දින වූ 2024 අප්‍රේල් 01 දක්වාම අදාල යන්ත්‍ර සඳහා භාවිතා කරමින් පැවතුණි. අදාළ භාණ්ඩ ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී නොගය ශූන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින රබර් බුෂ් ඒකක 200 ක් ඒකකයක් රු.79,082 ක් බැගින් රු.15,816,482 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.70,000(රු.350x200) ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම නොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින් රු.15,746,482 ක අලාභයක් සමාගමට සිදුව තිබුණි. මිලදී ගත් මෙම නොගය විගණිත දින වූ 2024 අප්‍රේල් 01 වන විටත් භාවිතයට නොගෙන ගබඩා ලේඛන තුළ ඇතුළත් කිරීමකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව සම්බන්ධක ඇණ(Coupling bolt) ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවා නිෂ්කාර්යව තබා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.39,571,405 ක් වූ ණය ගැනි ශේෂය තුළ ගොලු ණය ලෙස ප්‍රතිපාදනය කර නිබූ. වසර පහකට වැඩි කාලයක් නිස්සේ අයවිය යුතුව පවතින ණය ශේෂ වල එකතුව රු.6,701,486 ක් වූ අතර විගණින දිනය වන විටත් මෙම ශේෂයන් අයකර ගෙන නොනිබුණි.

(ආ) රු.35,867,000 ක මුදලක් වැය කර 2014 වර්ෂයේදී මිලදී ගෙන නිබුණු ක්‍රෂර් යන්ත්‍රයක් නිෂ්කාර්යව සමාගම පරිශ්‍රයේ තබා නිබුණු අතර එම යන්ත්‍රයට අදාල රඳවා ගැනීම් මුදල් රු.4,386,358 ක්ද නිරවුල් කිරීමකින් තොරව 2014 වර්ෂයේ සිට උපචිත වියදමක් ලෙස දක්වා නිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා නිබූ අතර මුළු ව්‍යාපෘතිය තුළින් රු.මිලියන 31.71 ක අලාභයක් සිදුවී නිබුණි. නවද, ව්‍යාපෘති කාර්යයන් සඳහා පස් අවුරුදු බදු පදනම මත ලබා ගන්නා ලද ඉඩමෙහි බදු කාලසීමාව 2018 සැප්තැම්බර් 05 දිනෙන් අවසන් වී නිබූ අතර බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් නිබුණද 2022 සැප්තැම්බර් මස සිට සමාගමට ව්‍යාපෘති භූමිය තුළට ඇතුළු වීම ඉඩම් හිමිකාර පාර්ශවය විසින් වළක්වා නිබූ අතර එම ආරවුල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඈ) සමාගම විසින් CIC සමාගම වෙත අලෙවි කරන ලද ERP පොහොර මෙ.ටොන් 393 ක නිසිය යුතු යැයි අපේක්ෂිත රොක් පොස්පේට් ප්‍රතිශතය නොනිබීම හේතුවෙන් එම පොහොර තොගය ආපසු එවා නිබුණි. ඒ සඳහා ප්‍රවාහන වියදම් හා පැටවීමේ කුලී වියදම් ලෙස රු.1,739,381 ක නිෂ්කාර්ය වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා නිබුණි. එම ERP තොගය අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සමඟ මිශ්‍ර කොට නැවත සැකසීම 2023 ජූලි 23 සිට 2023 අගෝස්තු 07 දින දක්වා කාල පරිච්ඡේදයේදී සිදුකර ඇතත් අලෙවි කර නොනිබුණි.

(ඉ) පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර නිබූ 2012 අප්‍රේල් 20 දිනැති අංක 16/2012 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඔනිජ ද්‍රව්‍ය ප්‍රාථමික ස්වරූපයෙන් අපනයනය කිරීම අධෛර්යමත් කරන බව දක්වා ඇති නමුත්, කිසිදු අගය එකතු කිරීමකින් තොරව පොස්පේට් ඛනිජය අපනයනය කිරීම සඳහා ගැණුම්කරුවන් තිදෙනෙකු වෙත දේශීය මිල මත අලෙවි කිරීමට සමාගම කටයුතු කර නිබුණි. එම ගැනුම්කරුවන් වෙත පොස්පේට් අලෙවි කිරීමේදී නිසි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බවට විගණනය වෙත සාක්ෂි ඉදිරිපත් නොවිය. සමාලෝචිත වර්ෂය තුළදී, සමාගම අදාළ ගැනුම්කරුවන් තිදෙනා

වෙත පොස්පේට් මෙ.ටොන් 13,207 ක ප්‍රමාණයක් දේශීය මිල මත අලෙවි කර රු.343,382,000 (මෙ.ටොන් 1 ක් රු.26,000 බැගින්) ක ආදායමක් උපයාගෙන තිබුණි.

(ඊ) යන්ත්‍රාගාරය සඳහා අවශ්‍ය අමතර කොටස්වල අවශ්‍යතාවය ඇගයීමක් සිදු කිරීමකින් තොරව මිලදී ගන්නා ලද රු.3,975,998 ක් වටිනා අමතර කොටස් සමාගමේ ගබඩාව තුළ වසර ගණනාවක සිට භාවිතයට ගැනීමකින් තොරව රඳවා ගෙන තිබුණි.

(උ) සමාගමේ ෂෙයාර්ය මට්ටමේ නිලධාරීන් වන මෙහෙයුම් කළමනාකරු, සැපයුම් නිලධාරී 2023 ජූලි 18 දින සිටද, අලෙවි විධායකවරයා ජනවාරි 12 දින සිටද ද්විතියික මට්ටමේ තත්ත්ව පාලන නිලධාරිවරයා 2023 අප්‍රේල් 26 දින සිට ද වැඩ තහනමට ලක් කර තිබූ අතර අලෙවි විධායක වරයාට හැර අනෙකුත් නිලධාරීන් තිදෙනා සඳහාම වැඩ තහනමට ලක්කළ දින සිට අඩ වැටුප් ලබා දීමට සමාගම කටයුතු කර තිබුණි. විගණන දිනය දක්වාම අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොමැති තත්ත්වයක් තුළ ඉහත නිලධාරීන් තිදෙනා රු901,805 ක අඩ වැටුප් මුදලක් සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඌ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ හා භාවිතයෙන් ඉවත් කරන ලද යන්ත්‍ර කොටස් එප්පාවල යන්ත්‍රාගාර පරිශ්‍රයේ අනාරක්ෂිතව දමා තිබූ අතර එම ද්‍රව්‍ය විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කල සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම වෙනුවෙන් රු. මිලියන 67.8 ක ප්‍රතිපාදන වෙන් කර ඇතත් ඒ තුළින් පරිසර හිතකාමී සහ නවීන ක්‍රියාවලියක් හරහා පොස්පේට් පොහොර සඳහා වන ජාතික අවශ්‍යතාවය සම්පූර්ණයෙන් අදාළව හෝ පවතින ගිණුම්කරණ පද්ධතිය වැඩි දියුණු කිරීමට රු.මිලියන 7.2 ක ප්‍රතිපාදන වෙන් කළද ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමසිංහ

විගණකාධිපති

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් ප්‍රකාශිතයි)

	සට.	2024 මාර්තු 31	2023 මාර්තු 31 *නැවත ප්‍රකාශිත*	*විචලනය*
ආදායම (ශුද්ධ)	**17**	1,080,038,780	546,100,063	533,938,717
විකුණුම් පිරිවැය	**18**	(534,021,036)	(339,448,879)	(194,572,157)
දළ ලාභය		**546,017,744**	**206,651,184**	**339,366,559**
කර්මාන්තශාලා සහ පරිපාලන පොදු කාර්යය	**19**	(290,347,077)	(225,401,693)	(64,945,384)
විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය	**20**	(12,471,603)	(11,203,293)	(1,268,309)
මූල්‍ය පිරිවැය	**21**	(3,614,425)	(9,899,783)	6,285,358
මෙහෙයුමෙන් ලද ලාභය		**239,584,638**	**(39,853,585)**	**279,438,223**
පොලී සහ වෙනත් ආදායම්	**22**	123,764,800	109,187,619	14,577,181
බදු පෙර ලාභය		**363,349,438**	**69,334,034**	**294,015,405**
බදු වියදම	**23**	(123,934,613)	(25,297,095)	(98,637,518)
වසර සඳහා ලාභය		**239,414,825**	**44,036,939**	**195,377,886**
වෙනත් විස්තීර්ණ ආදායම්				
වත්කම් ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු වගකීම	**25**	1,282,795	(3,494,158)	4,776,952
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	**30**	2,964,332	(24,563,329)	27,527,661
වර්ෂය සඳහා අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම		4,247,127	(28,057,487)	32,304,613
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**243,661,952**	**15,979,452**	**227,682,500**
කොටසකට ඉපැයුම (රු.)	**26**	**33.02**	**6.07**	**26.94**

45 සිට **53** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **25** සිට **44** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල **අනිවාර්ය** අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් ප්‍රකාශිතයි)

	සට.	2024 මාර්තු 31	2023 මාර්තු 31 *නැවත ප්‍රකාශිත*	*විචලනය*
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත සහ උපකරණ	**5**	250,272,258	287,864,579	(37,592,321)
කොටස්වල ආයෝජනය (GSMB Tech. Services (Pvt) Ltd)	**6**	1,000,000	1,000,000	-
		251,272,258	**288,864,579**	**(37,592,321)**
ජංගම වත්කම්				
තොග	**7**	234,119,769	259,306,473	(25,186,704)
වෙළඳ ලැබිය යුතු මුදල්	**8**	39,571,405	34,427,525	5,143,880
තැන්පතු, පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	**9**	160,641,638	165,628,095	(4,986,457)
ස්ථාවර තැන්පතු සහ හාණ්ඩාගාර බිල්පත්	**10**	602,001,770	560,584,374	41,417,396
මුදල් සහ මුදල් සමාන දෑ	**11**	181,133,593	1,468,992	179,664,601
		1,217,468,175	**1,021,415,459**	**196,052,715**
මුළු වත්කම්		**1,468,740,433**	**1,310,280,038**	**158,460,395**
හිමිකම සහ වගකීම්				
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**12**	72,510,000	72,510,000	-
ප්‍රත්‍යාගණන සංචිත		132,550,912	131,268,117	1,282,795
රඳවාගත් ඉපැයුම්		850,343,391	807,964,234	42,379,157
මුළු හිමිකම		**1,055,404,302**	**1,011,742,351**	**43,661,951**
ජංගම නොවන වගකීම්				
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	**13**	60,365,049	56,358,582	4,006,467
විලම්භිත බදු	**14**	29,899,148	27,618,049	2,281,099
		90,264,197	**83,976,631**	**6,287,566**
ජංගම වගකීම්				
වෙළඳ ගෙවිය යුතු දෑ		36,366,596	22,463,708	13,902,888
පාරිභෝගික අත්තිකාරම්	**8**	9,734,200	2,236,500	7,497,700
ගෙවිය යුතු ආදායම් බදු	**15**	79,148,892	23,186,666	55,962,226
අනෙකුත් ගෙවිය යුතු සහ උපචිත වියදම්	**16**	125,604,796	83,749,039	41,855,757
බැංකු අයිරා	**11**	72,217,451	82,925,144	(10,707,693)
		323,071,934	**214,561,058**	**108,510,877**
මුළු හිමිකම් සහ වගකීම්		**1,468,740,433**	**1,310,280,039**	**158,460,394**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව මම සහතික කරමි.

මූල්‍ය කළමණාකරු **සාමාන්‍යාධිකාරී**

45 සිට 53 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 25 සිට 44 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

G.W. MADUSHA UDANI FONSEKA
Director

සභාපති **අධ්‍යක්ෂක**

කොළඹ කොළඹ

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	එකතුව
			නැවත ප්‍රකාශිත	
2022 අප්‍රේල් 01 දිනට ශේෂය (පෙර වාර්තා කර ඇත)	**72,510,000**	**134,762,275**	**861,246,732**	**1,068,519,007**
ගැලපීම - නොගෙවූ ඉඩම් පරිහරණ ගාස්තු **(සටහන 24 - I)**	**-**	**-**	(33,907,391)	(33,907,391.43)
ගැලපීම - හදුනානොගත් අමුද්‍රව්‍ය තොග වෙනස **(සටහන 24 - II)**			(13,848,716)	(13,848,715.55)
2022 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**134,762,275**	**813,490,625**	**1,020,762,900**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය (නැවත ප්‍රකාශිත)	-	-	44,036,938	44,036,938
දේපල, පිරියත හා උපකරණ නැවත ඇගයීම සඳහා විලම්භිත බදු වගකීම		(3,494,158)	-	(3,494,158)
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	-	-	(24,563,329)	(24,563,329)
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම	-	-	(25,000,000)	(25,000,000)
2023 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**131,268,117**	**807,964,234**	**1,011,742,351**
2023 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**131,268,117**	**807,964,234**	**1,011,742,351**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	239,414,825	239,414,825
දේපල, පිරියත **හා උපකරණ නැවත ඇගයීම** සඳහා විලම්භිත බදු වගකීම **- (සටහන 25)**		1,282,795	-	1,282,795
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ - (සටහන 30)	-	-	2,964,332	2,964,332
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම	-	-	(200,000,000)	(200,000,000)
2024 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**132,550,912**	**850,343,391**	**1,055,404,303**

45 සිට 53 දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 25 සිට 44 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

		නැවත ප්‍රකාශිත
	2024 මාර්තු 31	**2023 මාර්තු 31**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
බදු වලට පෙර ලාභය	363,349,438	69,334,034
ගැලපීම් ;		
ක්ෂය වීම	45,496,206	42,699,032
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	13,290,119	9,710,038
ඉදිවෙමින් පවතින ප්‍රාග්ධන ලියාහැරීම	356,400	-
පොලී ආදායම	(114,847,166)	(104,861,497)
ලාභාංශ ආදායම	(4,120,166)	(300,000)
ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**303,524,831**	**16,581,607**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්		
තොග	25,186,704	(137,568,377)
වෙළඳ ලැබිය යුතු දෑ	(5,143,880)	4,043,143
තැන්පතු, පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	53,767,157	(10,830,351)
වෙළඳ ගෙවිය යුතු දෑ	13,902,888	20,779,332
පාරිභෝගික අත්තිකාරම්	7,497,700	936,500
අනෙකුත් ගෙවිය යුතු සහ උපචිත වියදම්	41,855,757	14,901,928
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ / (යෙදවූ) මුදල් ප්‍රවාහය	**440,591,157**	**(91,156,219)**
ගෙවූ ආදායම් බදු	(58,098,409)	(25,861,838)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගෙවීම	(6,319,320)	(9,225,655)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ / (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය	**376,173,428**	**(126,243,712)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල,පිරියත හා උපකරණ මත ආයෝජනය	(8,260,285)	(6,879,966)
ලැබූ පොලී	59,756,381	8,445,966
කෙටිකාලීන තැන්පතු වල ආයෝජන	(41,417,396)	20,295,436
ලැබූ ලාභාංශ	4,120,166	300,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**14,198,867**	**22,161,436**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	(200,000,000)	(25,000,000)
මූල්‍ය ක්‍රියාකරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(200,000,000)**	**(25,000,000)**
වර්ෂය තුළ මුදල් සහ මුදල් සමාන දෑ වල සිදුවූ ශුද්ධ වෙනස්වීම්	**190,372,294**	**(129,082,276)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	(81,456,152)	47,626,121
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 11)	**108,916,142**	**(81,456,153)**
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වලින් නිරූපනය කරනු ලබන්නේ ;	**2024 මාර්තු 31**	**2023 මාර්තු 31**
අතැති මුදල් සහ බැංකු	181,133,593	1,468,992
බැංකු අයිරාව	(72,217,451)	(82,925,144)
	108,916,142	**(81,456,153)**

45 සිට **53** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **25** සිට **44** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

5 දේපල,පිරියත හා උපකරණ

පිරිවැය/ ප්‍රත්‍යාගණනය	2023 මාර්තු 31 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම්	2024 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	150,248,121.22	-	-	150,248,121
අභ්‍යන්තර **මාර්ග**	65,139,730.22	-	-	65,139,730
යන්ත්‍ර සහ පිරියත	126,462,925.79	255,165	727,050	127,445,141
මෝටර් වාහන	96,515,000.00	-	-	96,515,000
කාර්යාල උපකරණ	7,611,457.17	1,645,524	1,771,488	11,028,469
විදුලි උපකරණ	4,059,399.93	339,727	(2,276,348)	2,122,779
ලී බඩු සහ සවිකිරීම්	8,995,901.91	236,229	(81,230)	9,150,901
රසායනාගාර උපකරණ	-	5,075,000	-	5,075,000
විදුලි අලි වැට	3,157,193.75	-	-	3,157,194
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	8,464,224.00	708,640	(140,960)	9,031,904
	470,653,954	**8,260,285**	**-**	**478,914,239**

ක්ෂය වීම	2023 මාර්තු 31 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	මාරුකිරීම්	2024 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	23,826,342	6,009,925	-	29,836,267
අභ්‍යන්තර **මාර්ග**	29,141,909	3,247,924	-	32,389,833
යන්ත්‍ර සහ පිරියත	35,572,231	10,208,629	528,034	46,308,894
මෝටර් වාහන	77,212,000	19,303,000	-	96,515,000
කාර්යාල උපකරණ	5,822,867	2,283,703	(246,424)	7,860,147
විදුලි උපකරණ	515,251	158,560	(228,984)	444,827
ලී බඩු සහ සවිකිරීම්	6,309,731	1,798,518	(70,661)	8,037,588
රසායනාගාර උපකරණ	-	124,375	-	124,375
විදුලි අලි වැට	-	631,439	-	631,439
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	4,745,444	1,730,134	18,034	6,493,612
	183,145,775	**45,496,206**	**-**	**228,641,981**

ශුද්ධ පොත් අගය	2023 මාර්තු 31 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	මාරුකිරීම්	2024 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	126,421,779	(6,009,925)	-	120,411,855
අභ්‍යන්තර **මාර්ග**	35,997,821	(3,247,924)	-	32,749,897
යන්ත්‍ර සහ පිරියත	90,890,695	(9,754,448)	199,016	81,136,247
මෝටර් වාහන	19,303,000	(19,303,000)	-	-
කාර්යාල උපකරණ	1,788,590	1,379,732	2,017,911	3,168,322
විදුලි උපකරණ	3,544,149	(1,866,197)	(2,047,364)	1,677,953
ලී බඩු සහ සවිකිරීම්	2,686,171	(1,572,858)	(10,570)	1,113,313
රසායනාගාර උපකරණ	-	4,950,625	-	4,950,625
විදුලි අලි වැට	3,157,194	(631,439)	-	2,525,755
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	3,718,780	(1,180,488)	(158,994)	2,538,292
	287,508,179	**(37,235,921)**	**-**	**250,272,258**

ඉදිවෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	2023 මාර්තු 31 දිනට ශේෂය	එකතු කිරීම්	මාරුකිරීම්	2024 මාර්තු 31 දිනට ශේෂය
පරිශ්‍රයේ විදුලි උත්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම	356,400	(356,400)	-	-
	356,400	**(356,400)**	**-**	**-**
එකතුව	**287,864,579**			**250,272,258**
භානිකරණය සඳහා වෙන්කිරීම්	**-**	-	-	**-**
	287,864,579			**250,272,258**

	2024 මාර්තු 31	*2023 මාර්තු 31*
6 **GSMB** ටෙක්නිකල් **සර්විසස්** (පුද්ගලික) සමාගමේ ආයෝජනය		
එකක් රුපියල් **10/-** බැගින් වූ කොටස් **100,000**	**1,000,000**	**1,000,000**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

		2023/24	2022/23
7	**තොග**		***නැවත ප්‍රකාශිත***
	වෙළඳ තොග - එප්පාවල (අවසාන නිමි)	51,516,709	70,278,082
	(අමුද්‍රව්‍ය තොග)	46,019,986	22,050,578
	සාමාන්‍ය තොග	147,263,003	177,657,742
		244,799,698	**269,986,402**
	යල්පැන ගිය තොග සඳහා වෙන්කිරීම	(10,679,929)	(10,679,929)
	තොග වෙනස සඳහා වෙන්කිරීම	-	-
		234,119,769	**259,306,473**
8	**වෙළඳ ලැබිය යුතු දේ**		
	ණයගැති විකුණුම් ERP/HERP - එප්පාවල		
	2024.03.31 දිනට ලැබිය යුතු ණයගැති	45,463,566	42,978,725
	ලැබූ ණයගැති අත්තිකාරම්	(9,734,200)	(2,236,500)
		35,729,366	**40,742,225**
	මුදලට විකුණුම් වල එකතු ගිණුම - එප්පාවල	-	-
	ණය ගැනියන් - පොල් පොහොර ව්‍යාපෘතිය - වාරියපොල	809,325	1,218,307
	(-) බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරීම		
	- එප්පාවල පරිශ්‍රය	(5,885,161)	(8,551,200)
	- වාරියපොල පරිශ්‍රය	(816,325)	(1,218,307)
		(6,701,486)	**(9,769,507)**
		29,837,205	**32,191,025**
9	**තැන්පතු, කලින් ගෙවූ සහ වෙනත් ලැබිය යුතු දෑ**		
	සේවක ණය සහ අත්තිකාරම්	54,801,325	38,112,325
	තැන්පතු සහ ඉදිරියට ගෙවීම්	29,537,075	32,510,904
	කෙටි කාලීන ආයෝජන වලින් ලැබිය යුතු (ස්ථාවර තැන්පතු) පොලී ආදායම	76,160,380	95,004,866
	කෙටි කාලීන ආයෝජන වලින් ලැබිය යුතු **(රෙපෝ)** පොලී ආදායම	142,857	-
		160,641,638	**165,628,095**
10	**ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්**		
	ස්ථාවර තැන්පතු	602,001,770	560,584,374
		602,001,770	**560,584,374**
11	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	රෙපෝ - ලංකා බැංකුව	180,000,000	-
	බැංකුවේ ඇති මුදල්	1,018,593	1,353,991
	අතැනි මුදල්	101,000	101,000
	මුද්දර සංචිතය	14,000	14,000
		181,133,593	**1,468,991**
	11.1 - බැංකුවේ ඇති මුදල්		
	ලංකා බැංකුව - එප්පාවල (A/C No 004641100)	418,762	373,959
	මහජන බැංකුව - එප්පාවල (170-100180000025)	91,392	808,713
	මහජන බැංකුව වාරියපොළ - (A/C No 144-100200000025)	508,439	171,319
	ලංකා බැංකුව - ග්‍රෑන්ඩ් පාස් - (A/C No 0009300713)	-	-
		1,018,593	**1,353,991**
	11.2 - බැංකු අයිරා		
	ලංකා බැංකුව - ග්‍රෑන්ඩ් පාස් - (A/C No 0009300713)	72,217,451	82,925,144
		72,217,451	**82,925,144**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

		2023/24	2022/23
12	ප්‍රකාශිත ප්‍රාග්ධනය		
	නිකුත් කර සම්පූර්ණයෙන්ම ගෙවා ඇත		
	සාමාන්‍ය කොටස් 7,251,000	**72,510,000**	**72,510,000**
13	**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**		
	2023 අප්‍රේල් 01 දිනට ශේෂය	**56,358,582**	**31,310,870**
	වත්මන් සේවා පිරිවැය	4,272,746	2,038,120
	අතීත සේවා පිරිවැය	-	2,975,288
	වර්ෂය සඳහා පොලී වියදම	9,017,373	4,696,630
	වර්ෂය තුල ගෙවීම්	(6,319,320)	(9,225,655)
	විශ්‍රාම බැදියාව මත සත්‍ය ගණන අලාභය	(2,964,332)	24,563,329
	2024 මාර්තු 31 දිනට ශේෂය	**60,365,049**	**56,358,582**
14	**විලම්බිත බදු**		
	වර්ෂයේ ආරම්භක ශේෂය	27,618,049	22,269,086
	ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගන්නා ලද	3,563,893	1,854,805
	වෙනත් **විස්තීර්ණ** ආදායම් තුල හඳුනා ගන්නා ලද	(1,282,795)	3,494,158
	වර්ෂය අවසාන ශේෂය	**29,899,148**	**27,618,049**
15	බදු අය කිරීම සඳහා ප්‍රතිපාදන		
	ඉ/ගෙ ශේෂය	23,346,169	25,765,717
	(+) වර්ෂය සඳහා ප්‍රතිපාදන	120,370,720	23,442,290
	(-) වර්ෂය සඳහා ගෙවීම්	(58,098,409)	(25,861,838)
		85,618,480	**23,346,169**
	බැරකම්		
	(-)ලැබිය යුතු රැඳවුම් බද්ද	(6,469,588)	(159,503)
	ප/ගෙ ශේෂය	**79,148,892**	**23,186,666**
16	අනෙකුත් ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්		***නැවත ප්‍රකාශිත***
	උපචිත වියදම්	88,384,960	71,397,708
	ගෙවිය යුතු රදවා ගැනීමේ බදු	2,990,250	2,319,503
	ගෙවිය යුතු එකතු කල අගය මත බදු/අයකරගත හැකි	14,655,386	-
	අනෙකුත් ගෙවිය යුතු දෑ	19,574,199	10,031,828
		125,604,796	**83,749,039**
17	ආදායම්		
	ශුද්ධ ආදායම් (එකතු කල අගය මත බදු වලට පෙර)		
	ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 50)	629,663,180	455,195,565
	ඊ.ආර්.පී. 33% (P2O5) විකුණුම්	30,132,200	-
	ගුණත්වයෙන් අඩු ඊ.ආර්.පී විකුණුම්	17,500	-
	එච්.ඊ.ආර්.පී	105,258,220	90,298,498
	මලු නොමැති ඊ.ආර්.පී. කි.ග්‍රෑ50 විකුණුම් 38%	314,967,680	-
	ඊ.ආර්.පී.(කි.ග්‍රෑ.25)	-	600,000
	එප්පාවල රබර් පොහොර අලෙවිය	-	6,000
	එකතුව	**1,080,038,780**	**546,100,063**
	(+) එකතු කල අගය මත බදු (18%) (ජනවාරි 24 - මාර්තු,24)	41,485,645	-
	දළ ආදායම **(එකතු කල අගය මත බදු සමඟ)**	**1,121,524,425**	**546,100,063**

18. විකුණුම් පිරිවැය		**2023/24**	**2022/23**	*විචලනය*
			නැවත ප්‍රකාශිත	
ආරම්භක වෙළඳ තොගය **(2023/04/01)** දිනට		**92,328,660**	**27,267,539**	**(65,061,122)**
වර්ෂය තුළ සිදුකරන ලද සෘජු වියදම්				
18.1 කාර්ය මණ්ඩල වේතන සහ ගෙවීම				
කාර්ය මණ්ඩල වේතන - කැනීම්		11,754,151	11,186,567	(567,584)
කාර්ය මණ්ඩල වේතන - ක්‍රශර්		26,206,171	22,975,974	(3,230,197)
කාර්ය මණ්ඩල වේතන - කම්හල		88,812,617	69,161,880	(19,650,737)
කාර්ය මණ්ඩල වේතන - නඩත්තුව		36,724,847	29,608,932	(7,115,915)
කාර්ය මණ්ඩල වේතන - විදුලිය		7,817,869	6,760,323	(1,057,546)
වෛද්‍ය යෝජනා ක්‍රමය		4,010,486	4,388,949	378,463
වාර්ෂික ප්‍රසාද දීමනා		12,066,122	2,883,403	(9,182,719)
වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම		17,462,724	5,664,579	(11,798,145)
		204,854,986	**152,630,606**	**(52,224,379)**
18.2 අමුද්‍රව්‍ය කැණීම්				
යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම		15,123,177	8,263,360	(6,859,817)
		15,123,177	**8,263,360**	**(6,859,817)**
18.3 රාජ්‍යභාගය				
රාජ්‍යභාගය		86,671,213	47,109,202	(39,562,011)
		86,671,213	**47,109,202**	**(39,562,011)**
18.4 විදුලි බලය සහ බලශක්තිය				
බලය - ක්‍රශර් (9%)		6,252,021	3,280,792	(2,971,229)
බලය -කම්හල (83%)		57,657,528	30,256,196	(27,401,331)
විදුලි ජනන යන්ත්‍ර සඳහා ඉන්ධන		222,071	2,745,265	2,523,194
		64,131,619	**36,282,254**	**(27,849,366)**
18.5 ඇසුරුම් ද්‍රව්‍ය				
පොලිප්‍රොප්ලීන් ඇසුරුම්		71,166,184	88,665,862	17,499,678
බදින කොකු		817,625	402,691	(414,934)
		71,983,809	**89,068,553**	**17,084,744**
18.6 බලපත්‍ර සහ අනුමැතිය				
පතල් කැණීමේ බලපත්‍රය		468,628	991,306	522,679
ඉඩම් පරිහරණ ගාස්තු		13,780,100	5,792,968	(7,987,131)
		14,248,727	**6,784,275**	**(7,464,453)**
18.7ක්ෂය වීම - සෘජු නිෂ්පාදනය				
P&M, විදුලි උපකරණ ආදී		16,501,489	15,207,224	(1,294,265)
		16,501,489	**15,207,224**	**(1,294,265)**
18.8 කම්හල් සහ ක්‍රශර් නඩත්තුව				
මිල් කම්හල් අමතර කොටස්.-5 රෝලර් (නව)		7,149,298	1,676,621	(5,472,677)
මිල් කම්හල් අමතර කොටස්.-5 රෝලර්		779,767	18,629,048	17,849,281
මිල් කම්හල් නඩත්තුව 160 TGM		11,009,196	4,760,864	(6,248,331)
TGM 160 - 6 රෝලර් **මිල්** - 2		10,464,947	2,452,715	(8,012,232)
ක්‍රශර් අමතර කොටස්		636,416	163,390	(473,026)
		30,039,624	**27,682,638**	**(2,356,985)**
18.9 තෙල් සහ ලිහිසි තෙල්				
තෙල් සහ ලිහිසි තෙල් - පතල්		102,001	167,827	65,827
තෙල් සහ ලිහිසි තෙල් - ක්‍රශර්		305,991	88,021	(217,970)
ලිහිසි තෙල් - කම්හල		2,344,439	2,684,879	340,440
		2,752,431	**2,940,728**	**188,297**

18.10 වාහන ඉන්ධන සහ නඩත්තුව						
විල්ලෝඩරය-ඉන්ධන-පතල්		214,240		57,428		(156,813)
විල්ලෝඩර ඉන්ධන (නව) - පතල්		1,085,455		902,773		(182,681)
විල්ලෝඩර නඩත්තුව - පතල්		77,021		46,089		(30,931)
924 කේ විල්ලෝඩරය - ඉන්ධන - පතල්		1,245,699		1,419,200		173,501
924 කේ විල්ලෝඩරය නඩත්තු - පතල්		1,756,675		308,784		(1,447,891)
විල්ලෝඩරය නඩත්තු (නව) - පතල්		574,536		171,268		(403,268)
අභ්‍යන්තර **ප්‍රවාහනය ට්‍රැක්ටරය 49-7541** - පතල්		102,480		100,022		(2,458)
අභ්‍යන්තර **ප්‍රවාහනය ට්‍රැක්ටරය 46 SRI 5636** - පතල්		1,892		2,467		575
ට්‍රෙලරය -44 Sri 6600 - පතල්		366		22,500		22,134
නව ට්‍රැක්ටර් ට්‍රෙලර් 1 - පතල්		22,312		2,870		(19,442)
නව ට්‍රැක්ටර් ට්‍රෙලර් NO 2 - පතල්		4,037		-		(4,037)
නව වතුර බවුසරය NCGA 4634 - පතල්		12,204		214,955		202,751
විපරය NCLR 2142 - පතල්		162,293		1,314,380		1,152,088
විපරය - NCLL 6146 - පතල්		230,320		106,130		(124,191)
WPLL 9354 DRUM ට්‍රක් - පතල්		23,333		82,345		59,013
NCLS-9309 Dump ට්‍රක් - පතල්		305,503		279,696		(25,807)
DUMP ට්‍රක් / (LL - 9354 LAL) - F - පතල්		45,351		50,219		4,867
විපරය / (LL - 6146) - F - පතල්		442,703		310,878		(131,826)
DUMP ට්‍රක් / (LJ - 9309 EICHER) - F- පතල්		719,304		409,122		(310,183)
විපරය / (LA - 2142 LAL) - F - පතල්		345,958		182,120		(163,838)
අභ්‍යන්තර **ප්‍රවාහනය** -ට්‍රැක්ටරය 270-0809 - පතල්		72,219		166,035		93,816
අභ්‍යන්තර **ප්‍රවාහනය** -ට්‍රැක්ටරය 49-2011 - පතල්		53,818		116,952		63,135
අභ්‍යන්තර **ප්‍රවාහනය** - SRI 6603 - පතල්		2,264		3,517		1,253
අභ්‍යන්තර **ප්‍රවාහනය** - SRI 6606 - පතල්		2,540		4,167		1,627
අභ්‍යන්තර **ප්‍රවාහනය** - SRI 6607 - පතල්		2,365		3,517		1,152
විල්ලෝඩර (FURUKAWA) - F - ක්‍රශර්		214,240		57,428		(156,813)
විල්ලෝඩර (FURUKAWA) - M - ක්‍රශර්		73,221		31,148		(42,073)
විල්ලෝඩර (WA 180) - F - ක්‍රශර්		1,085,455		705,978		(379,477)
විල්ලෝඩර(WA 180) - M		257,535		86,639		(170,897)
විල්ලෝඩර (CAT 924 - K) - F - ක්‍රශර්		1,288,777		1,163,820		(124,958)
විල්ලෝඩර (CAT 924 - K) - M - ක්‍රශර්		1,289,402		176,350		(1,113,051)
DUMP ට්‍රක්/ (LJ - 9309 EICHER) - M -ක්‍රශර්		305,503		224,526		(80,977)
DUMP ට්‍රක් / (LJ - 9309 EICHER) - F -ක්‍රශර්		719,304		299,800		(419,504)
විපරය / (LL - 6146) - F - ක්‍රශර්		442,703		180,827		(261,876)
විපරය / (LL - 6146) - M -ක්‍රශර්		229,770		49,649		(180,122)
DUMP ට්‍රක් / (LL 9354 LAL) - F - ක්‍රශර්		45,351		25,989		(19,362)
DUMP ට්‍රක් / (LL - 9354 LAL) - M- ක්‍රශර්		23,333		44,927		21,594
විපරය/ (LA - 2142 LAL) - F - ක්‍රශර්		345,958		116,296		(229,663)
විපරය/ (LA - 2142 LAL) - M - ක්‍රශර්		158,493		184,730		26,238
ට්‍රැක්ටරය F & M - ක්‍රශර්		3,600		28,017		-
අභ්‍යන්තර ප්‍රවාහනය - ක්‍රශර්		283,210		326,839		43,629
ෆෝක්ලිෆ්ට් ඉන්ධන - කම්හල		-		491,598		491,598
ෆෝක්ලිෆ්ට් නඩත්තු -කම්හල		2,370		156,003		153,633
ෆෝක්ලිෆ්ට් ඉන්ධන -කම්හල		-		345,914		345,914
ෆෝක්ලිෆ්ට් නඩත්තු -කම්හල		-		121,126		121,126
ෆෝක්ලිෆ්ට් ඉන්ධන (UNI CARRIER) - කම්හල		2,400		439,692		437,292
ෆෝක්ලිෆ්ට් නඩත්තු (UNI CARRIER) -කම්හල		-		79,289		79,289
ෆෝක්ලිෆ්ට් (NISSAN) - F - කම්හල		860,296		162,623		(697,674)
ෆෝක්ලිෆ්ට් (NISSAN) - M - කම්හල		320,809		214,751		(106,058)
ෆෝක්ලිෆ්ට් (MITSUBISHI) - F -කම්හල		378,993		24,980		(354,013)
ෆෝක්ලිෆ්ට් (MITSUBISHI) - M -කම්හල		131,696		118,060		(13,636)
විල්ලෝඩර (WA 180) - M -කම්හල		257,535		76,149		(181,387)
විල්ලෝඩර (CAT 924 - K) - F -කම්හල		1,288,777		939,363		(349,415)
විල්ලෝඩර (CAT 924 - K) - M - කම්හල		1,289,402		195,662		(1,093,740)
විල්ලෝඩර (FURUKAWA) - F කම්හල		214,240		57,428		(156,813)
විල්ලෝඩර (FURUKAWA) - M කම්හල		77,021		31,148		(45,873)
ෆෝක්ලිෆ්ට් (UNI CARRIER) - F-කම්හල		981,625		-		(981,625)
ෆෝක්ලිෆ්ට් (UNI CARRIER) - M-කම්හල		155,131		271,545		116,414
විල්ලෝඩර(WA 180) - F-කම්හල		1,085,455		655,095		(430,360)
		21,316,496		**14,360,820**		**(6,980,093)**

18.11 ආයුධ සහ මෙවලම් නඩත්තුව				
පතල් උපකරණ සහ නඩත්තුව - පතල		-	18,200	18,200
සම්පීඩක නඩත්තුව - පතල		17,200	81,187	63,987
පුද්ගල ආරක්ෂණ උපකරණ - පතල		71,151	97,072	25,921
පුද්ගල ආරක්ෂණ උපකරණ - ක්‍රශර්		25,445	15,478	(9,967)
ආයුධ සහ මෙවලම් - ක්‍රශර්		856,666	7,625	(849,041)
පුද්ගල ආරක්ෂණ උපකරණ - කම්හල		854,531	697,577	(156,954)
ආයුධ සහ මෙවලම් -කම්හල		1,019,537	181,620	(837,917)
අසූරන වැසුම් යන්ත්‍ර වියදම් - කම්හල		321,108	26,890	(294,218)
විදුලි ජනන යන්ත්‍ර නඩත්තුව - WS		4,090	64,417	60,328
මෙවලම් සහ උපකරණ නඩත්තු කිරීම -WS		1,102,860	1,178,037	75,177
පරීක්ශනාගාර වියදම්		2,438,827	166,072	(2,272,755)
පරීක්ශනාගාර **ගොඩනැගිලි** නඩත්තුව		261,597	3,963	(257,635)
වැඩහල් ගොඩනැගිල්ල		104,892	159,047	54,155
ක්‍රශර් ගොඩනැගිල්ල		24,226	360,813	336,587
Grizly නඩත්තු කිරීම		253,799	-	(253,799)
පතල් කාර්යාලය		35,102	14,444	(20,658)
ජල සැපයුම් නඩත්තුව		1,301,466	126,418	(1,175,047)
නිමි භාණ්ඩ ගබඩා නඩත්තු කිරීම		2,644,125	-	(2,644,125)
කම්හල් ගොඩනැගිල්ල		76,424	53,476	(22,948)
බර මැනීමේ තරාදි නඩත්තුව		186,207	40,190	(146,017)
පාලම් තරාදි නඩත්තුව		6,246	139,954	133,708
		11,605,499	**3,432,480**	**(8,173,019)**
මුළු වියදම්		**539,229,070**	**403,762,140**	**(135,491,347)**
ආරම්භක තොග වියදම්		**631,557,731**	**431,029,679**	**(200,552,469)**
අවසාන වෙලඳ තොගය **2024.03.31** දිනට		(97,536,694)	(92,328,660)	5,208,034
විකුණුම් පිරිවැය LPL		**534,021,036**	**338,701,018**	**(195,320,018)**
සෘජු පිරිවැය - CFMP		**-**	**747,860**	**747,860**
19.කර්මාන්තශාලා සහ පරිපාලන කටයුතු		**2023/24**	**2022/23**	*විචලනය*
			නැවත ප්‍රකාශිත	
19.1 කාර්ය මණ්ඩල වේතන සහ ගෙවීම්				
කාර්ය මණ්ඩල වේතන - මානව සම්පත්		23,321,421	20,524,993	(2,796,428)
කාර්ය මණ්ඩල වේතනය - ගිණුම් සහ මූල්‍ය		13,914,482	11,990,871	(1,923,611)
කාර්ය මණ්ඩල වේතනය - විගණනය		2,703,436	3,056,694	353,258
කාර්ය මණ්ඩල වේතනය - වත්ත		7,506,488	7,051,530	(454,958)
කාර්ය මණ්ඩල වේතනය - තොරතුරු තාක්ෂණය		2,112,433	1,729,186	(383,247)
කාර්ය මණ්ඩල වේතනය - ආරක්ෂණ		29,847,526	25,803,363	(4,044,163)
කාර්ය මණ්ඩල වේතනය - සැපයුම්		6,692,742	5,418,068	(1,274,673)
කාර්ය මණ්ඩල වේතනය - ප්‍රවාහන		24,768,821	19,350,950	(5,417,871)
කාර්ය මණ්ඩල වේතනය - ප්‍රධාන කාර්යාලය		9,313,558	8,850,085	(463,473)
කාර්ය මණ්ඩල වේතනය - ගබඩාව		27,263,399	18,263,199	(9,000,200)
සේවක සුභසාධනය		19,429,740	19,964,058	534,318
වෛද්‍ය යෝජනා ක්‍රමය		2,673,657	2,925,966	252,309
වාර්ෂික දීමනා		8,044,081	1,922,268	(6,121,813)
ලෙඩ නිවාඩු මුදල්		11,641,816	3,776,386	(7,865,430)
පාරිතෝෂිකය		13,290,119	9,710,038	(3,580,081)
සේවක පුහුණුව - HO		69,422	-	(69,422)
ශිෂ්‍ය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය		294,000	461,000	167,000
සේවක පුහුණුව - වැඩ බිම		819,705	254,070	(565,635)
		203,706,846	**161,052,726**	**(42,654,120)**
19.2 විදුලි බලය හා බලශක්තිය				
බලය(8%) - එප්පාවල **කාර්යාලය**		5,557,352	2,916,260	(2,641,092)
විදුලිය - HO		1,382,087	676,025	(706,061)
		6,939,439	**3,592,285**	**(3,347,153)**

19.3 ප්‍රවාහන හා යැපීමේ දීමනා				
වාහන කුලී		199,404	337,576	138,172
ප්‍රවාහන හා යැපීමේ දීමනා - වැඩ බිම		4,602,779	5,735,581	1,132,802
ප්‍රවාහන හා යැපීමේ දීමනා - HO		1,153,041	1,478,970	325,929
		5,955,224	**7,552,127**	**1,596,904**
19.4 දුරකථන , තැපැල් සහ සන්නිවේදනය				
තැපැල් සහ විදුලි පණිවුඩ		183,985	70,263	(113,722)
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග නඩත්තුව		81,368	50,721	(30,647)
දුරකථන - 02549121		4,437	22,930	18,493
දුරකථන - 02549290		2,757	15,194	12,437
දුරකථන - 02549400		3,621	39,677	36,056
දුරකථන - 2249601		5,154	27,008	21,854
දුරකථන - 2249647		3,476	22,250	18,774
ADSL/LEASED ලයින් වියදම		449,577	389,541	(60,035)
පැමිණීමේ සහ වැටුප් ගෙවීමේ ගාස්තුව		486,066	461,168	(24,898)
තැපැල් සහ මුද්දර		35,683	23,520	(12,163)
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය		682,898	670,729	(12,169)
දුරකථන - 459907		6,513	105,483	98,970
දුරකථන - 459908		151,189	138,379	(12,811)
දුරකථන - 459906		2,545	42,303	39,759
දුරකථන - 459909		48,841	39,083	(9,757)
දුරකථන බිල් ආපසු ගෙවීම		338,087	93,709	(244,378)
දුරකථන - 472698		15,916	15,323	(593)
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග නඩත්තුව		637,252	580,401	(56,851)
IP VPN ගාස්තු		1,038,705	1,000,033	(38,671)
දැන්වීම්		1,945,917	519,547	(1,426,371)
		6,123,986	**4,327,264**	**(1,796,723)**
19.5 ගොඩනැගිලි සහ වෙනත් නඩත්තු වියදම්				
කාර්යාල උපකරණ		46,469	758	(45,711)
කාර්යාල නඩත්තුව		673,499	89,447	(584,052)
විදුලි උපකරණ		841,625	1,310,172	468,546
පරිශ්‍ර /සේවා		811,301	297,114	(514,187)
ප්‍රධාන **ගබඩා**		114,986	86,684	(28,302)
ආරක්ෂාව සහ ප්‍රවාහන - කායර්ාලය		267,414	1,783	(265,631)
ආපනශාලා සහ සුභසාධන ගොඩනැඟිල්ල		22,479	20,793	(1,686)
විධායක නිල නිවාස		127	13,385	13,258
ඇළ අසල සේවක නිල නිවාස		1,162,802	5,768	(1,157,034)
සාමාන්‍යාධිකාරීගේ නිල නිවාස		2,780	1,232	(1,548)
කම්කරු නිල නිවාස නගරය		-	3,990	3,990
සභාපතිගේ නිල නිවාස		27,527	107,484	79,956
ආරක්ෂක නිලධාරීන්ගේ නිල නිවාස		-	2,914	2,914
සේවා ස්ථානය		784	10,100	9,316
ආරක්ෂක කුටිය - 02		868	-	(868)
ප්‍රථමාධාර ගොඩනැගිල්ල		-	17,277	17,277
විදුලි ජනන යන්ත්‍ර ගොඩනැගිල්ල		104,475	116	(104,358)
ප්‍රධාන කාර්යාලය		144,925	29,472	(115,453)
බර පාලම් ගොඩනැගිල්ල		16,488	-	(16,488)
සේවක විවේක කාමර - කැණිම		6,099	4,838	(1,261)
සේවක විවේක කාමර - කම්හල්		146,248	72,288	(73,959)
රියදුරන්ගේ විවේක කාමරය		-	642	642
වාහන ගරාජය		567	-	(567)
සාමාන්‍යාධිකාරි /නි.සාමාන්‍යාධිකාරි කායර්ාලය		17,610	1,815	(15,795)
වැසිකිළි		148,063	62,554	(85,510)
ප්‍රධාන ජල ටැංකිය		1,975	-	(1,975)
සභාපති/විධායක අධ්‍යක්ෂ නිල නිවාස		-	3,561	3,561
විදුලි මාර්ග නඩත්තුව		127,227	395,841	268,614
දුරකථන මාර්ග නඩත්තුව		9,000	9,690	690
අමුද්‍රව්‍ය ගබඩාව		93,450	-	(93,450)
කාර්යාල උපකරණ නඩත්තු කිරීම		-	21,840	21,840
කුළී - ප්‍රධාන කාර්යාලය		1,914,068	1,510,604	(403,464)
කල්බදු - ඉඩම්		609,626	789,626	180,000
ජලය		180,417	124,289	(56,128)
		7,492,901	**4,996,076**	**(2,496,824)**

19.6 පොත්, මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය				
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය		2,026,571	1,863,475	(163,096)
පොත් සහ වාරික ප්‍රකාශන		57,937	9,090	(48,847)
පූවත්පත් සහ වාරික ප්‍රකාශන		9,900	126,370	116,470
		2,094,409	**1,998,935**	**(95,474)**
19.7 රක්ෂණය සහ ආරක්ෂාව				
ආරක්ෂක අයිතම		10,000	4,000	(6,000)
ගිනි නිවන උපකරණ		324,038	25,223	(298,815)
භදිසි අනතුරු රක්ෂණය		890,407	483,538	(406,869)
මාර්ගස්ථ මුදල් රක්ෂණය		39,379	30,261	(9,119)
වැඩ බිමේ රක්ෂණය		428,605	338,162	(90,443)
		1,692,429	**881,184**	**(811,245)**
19.8 රැස්වීම් , නීතිමය සහ වෘත්තීය වියදම්				
විගණන ගාස්තු		372,740	400,000	27,260
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු		2,019,075	954,015	(1,065,060)
අධ්‍යක්ෂවරුන්ගේ **වියදම්**		274,841	246,010	(28,831)
ටෙන්ඩර් මණ්ඩල වියදම්		120,000	46,000	(74,000)
වෘත්තීය ගාස්තු		2,579,075	1,190,850	(1,388,225)
ලේකම් ගාස්තු		1,010,106	551,279	(458,827)
නීතිමය වියදම්		2,169,779	17,500	(2,152,279)
විගණන සහ කළමනාකරණ කමිටු		423,113	332,272	(90,842)
		8,968,728	**3,737,926**	**(5,230,803)**
19.9 වාහන සහ නඩත්තුව				
ඩම්ප් ට්‍රක් වාහන අංක NCLJ9309		-	106,599	106,599
වාහන අංක. NC GA 1627		245,402	358,201	112,799
වාහන අංක. NCJR 9672		821,960	312,100	(509,860)
වාහන අංක. NCJR 9680		1,051,239	225,592	(825,647)
වාහන අංක. NC PA 7906		400,894	350,504	(50,390)
වාහන අංක. 252 - 5963		44,251	17,600	(26,651)
වාහන අංක. 154 - 3641		7,497	5,937	(1,559)
වාහන අංක. NCMA-8755		1,560,085	828,875	(731,210)
වාහන. BUS. NCNB 5469		667,528	733,916	66,388
වාහන අංක. WPPC 6891		1,444,486	1,076,744	(367,742)
වාහන අංක. DOUBLE CAB - WPPF 5672		1,629,789	853,716	(776,073)
වාහන අංක. DOUBLE CAB - WPPF 5673		1,753,499	1,705,892	(47,607)
සේවා ස්ථාන ද්‍රව්‍ය		462,368	182,987	(279,381)
වාහන අංක. WPKQ4329		3,091,370	1,122,226	(1,969,144)
වාහන අංක. HK-4629		8,902	7,794	(1,108)
යතුරු පැදි - NC BCB 8782		13,805	16,779	2,974
යතුරු පැදි - NC BCB 8777		28,606	25,213	(3,393)
		13,231,683	**7,930,676**	**(5,301,007)**
19.10 පොදු වියදම් සහ ප්‍රතිපාදන				
බොල් සහ අඩමාණ ණය ගැනියන්		(333,380)	(799,357)	(465,977)
ක්ෂය වීම් - වකු		28,994,717	27,491,809	(1,502,908)
උත්සව වියදම්		-	275,073	275,073
විවිධ වියදම්		3,200,908	824,008	(2,376,900)
සාමාන්‍ය **තොග** කපා හැර ඇත		905,303	-	(905,303)
සාමාන්‍ය වියදම්		633,757	967,738	333,982
පර්යේෂණ සහ සංවර්ධනය		740,130	573,225	(166,906)
		34,141,434	**29,332,495**	**(4,808,939)**
		290,347,077	**225,401,693**	**(64,945,384)**

20. විකිණීම සහ බෙදා හැරීමේ වියදම්				
		2023/24	**2022/23**	*විචලනය*
කාර්ය මණ්ඩල වේතනය-අලෙවිකරණය		6,654,702	8,220,355	1,565,653
අලෙවි - දුරකථන අංකය 071 4 223 222		28,064	25,546	(2,518)
විකුණුම් ප්‍රවර්ධනය		46,621	34,095	(12,525)
ව්‍යාපාර ප්‍රවර්ධනය		327,806	181,243	(146,563)
බනිජ බද්ද		5,400,231	2,730,433	(2,669,798)
		12,457,424	**11,191,672**	**(1,265,752)**
<u>විකුණුම් වෙළඳ සැල</u>				
- ජලසම්පාදන		10,073	7,301	(2,772)
- විදුලිය		3,271	1,321	(1,950)
- ප්‍රවාහනය සහ තොග හැසිරවීම		836	-	(836)
- **ප්‍රවාහන සහ තොග හැසිරවීම**		-	3,000	3,000
		12,471,602.84	**11,203,293.44**	**(1,268,309.40)**
21. මූල්‍ය පිරිවැය				
		2023/24	**2022/23**	*විචලනය*
බැංකු ගාස්තු		195,133	150,287	(44,845)
අයිරා පොළිය		3,419,292	9,749,495	6,330,203
		3,614,425	**9,899,783**	**6,285,358**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

			2023/24	2022/23
22	**පොලී සහ වෙනත් ආදායම්**			
	22.1 පොලී ආදායම			
	ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොලිය		108,468,069	103,681,717
	ලැබුණූ පොලිය රෙපෝ		6,379,098	1,179,780
	කායර් මණ්ඩලයට ලබා දුන් ණය වලින් ලැබෙන පොලිය		3,297,867	2,676,518
	උප එකතුව		**118,145,034**	**107,538,015**
	22.2අනෙකුත් ආදායම්			
	විවිධ ආදායම්		1,499,601	1,349,604
	ලාභාංශ ආදායම		4,120,166	300,000
	උප එකතුව		**5,619,767**	**1,649,604**
			123,764,800	**109,187,619**
	මෙහෙයුම් වලින් ලද ලාභය පහත අයිතම අඩු කල පසු දක්වා ඇත .			
	කාර්ය මණ්ඩල පිරිවැය		409,335,027	320,409,745
	ක්ෂය වීම		45,496,206	42,699,032
	විගණන ගාස්තු		372,740	400,000
	අධ්‍යක්ෂ ගාස්තු		2,019,075	954,015
	අධ්‍යක්ෂ වියදම්		274,841	246,010
	සේවක **අර්ථසාධක** අරමුදල සඳහා ගෙවීම 22%		50,397,606	43,413,086
	සේවක භාරකාර අරමුදල සඳහා ගෙවීම 3%		6,872,401	5,919,966
	පාරිතෝෂික ගෙවීම්		6,319,320	9,225,655
23	ආදායම් බදු වියදම්			
	වර්ෂයේ ලාභය මත ආදායම් බද්ද		120,370,720	23,442,290
	විලම්භිත බදු වලින් මාරු කිරීම		3,563,893	1,854,805
			123,934,613	**25,297,095**
23.1	ආදායම් බදු වියදම් සැසඳීම			
	බදු වලට පෙර ලාභය		363,349,438	60,581,651
	වෙළඳ නොවන ආදායම්		(122,598,580)	(107,838,015)
	ඉඩදිය නොහැකි වියදම් එකතුව		72,280,319	61,897,526
	බදු සඳහා වගකිව යුතු **පූර්ව** වසර ගැලපීම්		-	-
	ඉඩ දිය හැකි වියදම් එකතුව		(30,260,882)	(35,511,436)
	තක්සේරු කල හැකි ව්‍යාපාර ආදායම		**282,770,296**	**(20,870,274)**
	වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායම් සහ නිදහස් ආදායම		**118,145,034**	**107,838,015**
	නිදහස් ආදායම්		-	-
	අයකරගතහැකි අලාභය	**23.2**	-	(20,870,274)
	ආයෝජනයෙන් තක්සේරු කළ හැකි ආදායම්		**118,145,034**	**86,967,741**
	තක්සේරු කළ හැකි මූළු ආදායම්		**400,915,330**	**86,967,741**
	සූදුසුකම් ලත් ගෙවීම්		-	-
	බදු අය කළ හැකි ආදායම්		**400,915,330**	**86,967,741**
	බදු අය කල හැකි ව්‍යාපාර ආදායම් මත බද්ද	30%	84,831,088.81	-
	බදු අය කල හැකි ආයෝජන ආදායම් මත බද්ද	30%	35,443,510.10	13,000,161
		24%		10,400,129
	ලාභාංශ ආදායම් මත බද්ද	14%	-	42,000
	පසුගිය වසරට අදාළව / (අධික) ප්‍රතිපාදන යටතේ		96,121	-
	වත්මන් ආදායම් බදු වියදම්		**120,370,720**	**23,442,290**
23.2	බදු අලාභය			
	ඉදිරියට ගෙනා අලාභය		-	-
	සිදුවී ඇති අලාභය / (ලාභ)		-	20,870,274
			-	20,870,274
	වර්ෂය තුළ උපලබ්ධ කරගත් අලාභය		-	(20,870,274)
	ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන ගිය අලාභය		**-**	**-**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

24 ගැලපීම් පෙර වසරට අදාළ වේ

24 - I වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නොගෙවූ ඉඩම් පරිහරණ ගාස්තු සඳහා ප්‍රතිපාදන

2024.02.19 දිනැති ලිපිය මගින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2016 සිට 2022 දක්වා ඔවුන් සතු ඉඩම උතුරු ගල්කොරි නිෂ්පාදනය සඳහා ඉඩම් පරිහරණ ගාස්තු ලෙස රු. 33,907,391.43 (වැට බද්දට පෙර) ලංකා පොස්පේට් සමාගමෙන් ඉල්ලුම් කර ඇත. මෙම කාරණය 2023 වසරේ අග භාගයේදී හෙළදරව් වී ඇත.

විස්තරය

2022 මාර්තු 31 දිනට ගැලපීම		***වගකීම් වලට වන බලපෑම***
උපචිත ගාස්තු		33,907,391
ඉදිරියට ගෙන යන අගයන් සඳහා ගැලපීම් - අවසන් අමුද්‍රව්‍ය තොග (2022 මාර්තු 31) අඩු තක්සේරුව නිවැරදි කිරීම		**33,907,391**
		හිමිකමට වන බලපෑම
රදවාගත් ඉපැයීම් ඉ/ගෙ		(33,907,391)
ලාභ සහ අලාභ ප්‍රකාශයේ සිදුකරන ලද ගැලපීම් (2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා) - ලාභය අධි ප්‍රකාශනය නිවැරදි කිරීම		**(33,907,391)**

24 - II ගැලපීම - හඳුනානොගත් අමුද්‍රව්‍ය තොග වෙනස

සමාගම විසින් 2023.03.31 දිනට පහත සඳහන් පරිදි අමුද්‍රව්‍යවල භෞතික හා පොත් ශේෂවල වෙනසක් හඳුනාගෙන තිබුණි.

ප්‍රමාණය (මෙ.ටෝ.)	***ERP***	***HERP***
පොත් ශේෂය	16194	816
භෞතික සත්‍යාපනයට අනුව ශේෂය	9954	495
හිඟය	6241	321

වටිනාකම -(රු.)	***ERP***	***HERP***	
පොත් ශේෂය	34,177,679.69	1,721,613.51	
භෞතික සත්‍යාපනයට අනුව ශේෂය	21,006,652.06	1,043,925.58	
වෙනස	13,171,027.63	677,687.92	
2022/2023 සඳහා කර ඇති ප්‍රතිපාදන	7,285,350.87	1,467,031.61	**8,752,382.48**
සකස් කල යුතු ඉතිරි මුදල් ශේෂය	5,885,676.75	(789,343.68)	**5,096,333.07**
එකතුව	13,171,027.63	677,687.92	**13,848,715.55**

සමාගම තොග සත්‍යාපන පරාමිතීන් හඳුන්වා දීමට සහ ඒ අනුව තොග වෙනස තක්සේරු කිරීමට ස්වාධීන ඉංජිනේරු වාර්තාවක් කැඳවා ඇතග ඉංජිනේරුවන්ට අනුවල ඉහත වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වසර ගණනාවක් තුළ අමුද්‍රව්‍ය තොග ගොඩගැසීමේ ක්‍රමයේ වෙනස්වීම් සහ කැනීම් නිමැවුමේ ඉහළ තෙතමනයක් තිබීමයි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022/2023 වර්ෂයේදී රු.8,752,342.48 ක අපනයනය සඳහා වෙන්කිරීමේ මූලික විමර්ෂන වාර්තාව පදනම් කරගෙන සිදුකරන ලදී. තවද අවසන් වාර්තාවට අනුව හඳුනාගත් මුළු වෙනස 2023/2024 විමර්ෂනයේදී මූල්‍ය වාර්තාවලදී පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස දක්වා ඇත.

2022 මාර්තු 31 දිනට ගැලපීම

		වත්කම් වලට වන බලපෑම
ඉදිරියට ගෙන යන අගයන් සඳහා ගැලපීම් - අවසන් අමුද්‍රව්‍ය තොග		(13,848,715.55)
		ලාභදායීත්වයට වන බලපෑම
ලාභ සහ අලාභ ප්‍රකාශයේ සිදුකරන ලද ගැලපීම් - අධි ප්‍රකාශනය නිවැරදි කිරීම		(13,848,715.55)

2023 මාර්තු 31 දිනට ගැලපීම

		වගකීම් වලට වන බලපෑම
තොග වෙනස සඳහා ප්‍රතිපාදන		(8,752,383)
ඉදිරියට ගෙන යන අගයන් සඳහා ගැලපීම් - (2022 මාර්තු 31) ප්‍රතිපාදන ආපසු ගැලපීම්		**(8,752,383)**
		හිමිකම් වලට වන බලපෑම
රදවාගත් ඉපැයීම් ඉ/ගෙ		8,752,383
ලාභ සහ අලාභ ප්‍රකාශයේ සිදුකරන ලද ගැලපීම් (2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා) - ලාභය අඩුවෙන් තක්සේරු කිරීම නිවැරදි කිරීම		**8,752,383**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම			
2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්			
		(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)	
25	**ප්‍රත්‍යාගණන සංචිත මත විලම්භිත බදු ගැලපීම**		
		2023/24	***2022/23***
	නැවත තක්සේරු කිරීමේ අතිරික්තය (මෝටර් වාහන නොමැතිව)	55,931,086	55,931,086
	(-) ප්‍රත්‍යාගණන අතිරික්තය මත ක්ෂය (වසර අවසානයේදී)	(21,379,909)	(17,103,927)
	ප්‍රත්‍යාගණය මත ලාභය	**34,551,177**	**38,827,159**
	විලම්භිත බදු වගකීම ප/ගෙ	11,648,148	8,153,990
	විලම්භිත බදු වගකීම ඉ/ගෙ	10,365,353	11,648,148
	වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම සහ ප්‍රත්‍යාගණන අතිරික්තය ගැලපීම	**1,282,795**	**(3,494,158)**
26	**කොටසක ඉපැයීම**		
	කොටසකට සාමන්‍ය ඉපැයීම් ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට බෙදාහැරිය හැකි ලාභය වසර තුළ බර තැබූ සාමාන්‍ය කොටස්වල එකතුවෙන් බෙදීම මතය.		
	සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ ලාභය (රු.)	239,414,825	44,036,939
	බරකළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (අංක)	7,251,000	7,251,000
	කොටසකට ඉපැයීම (රු.)	**33.02**	**6.07**

27. මූල්‍ය අවදානම කළමනාකරණය

වෙළඳපොළ අවදානම් (මුදල් අවදානම පොළි අනුපාත අවදානම සහ මිල මට්ටම් අවදානම් ඇතුලත්ව) ණය අවදානම, ද්‍රවශීල අවදානම් ආදී විවිධාකාර වූ මූල්‍ය අවදානම් වලට සමාගම භාජනය වේ. සමාගමක සමස්ථ අවදානම් කළමනාකරන ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවදානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ මූලික මූල්‍ය උපකරණ කෙටිකාලීන තැන්පතු, මුදල් වෙළඳපොළ ආයෝජන, සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය වැඩි කිරීම හා පවත්වාගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම වේ. වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු ආදී වූ ව්‍යාපාර කටයුතු වලින් සෘජුව ඇති වූ මූල්‍ය උපකරණ ද සමාගම සතුව ඇත.

(a) මූල්‍ය අවදානම

මූල්‍ය වත්කම්වල තත්ත්වය (ගුණය) හෝ හානිකරණයක් නොමැතිව තක්සේරු කලහැකි වනුයේ බාහිර ණය අනුපාත (තිබේ නම්) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවදානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුලත්වය.

(b) වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ තුල අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ලැබිය යුතු ශේෂවල මූල්‍ය තත්ත්වය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් ආයතනය විසින් සිදුකරනු ලැබේ. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායම් පිළිබඳව සැළකිය යුතු ණය අවදානමක් සමාගම සතුව නැත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා ඇගයීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙන ඇත.

(c) ද්‍රවශීල අවධානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනි. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට මූල්‍ය අංශය විසින් අඛණ්ඩව අදාළ පුරෝකථනයන් අධීක්ෂණය කරයි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත මුදල් රාජ්‍ය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තාකරන දිනයේදී සමාගම සතුව ස්ථාවර තැන්පතු රුපියල් 602,001,770/- (2023.03.31 රු. 560,584,374/-) පැවතීය. එය ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය කිරීමෙහිලා අවශ්‍ය මුදල් පහසුවෙන් මුදල් ලබා ගැනීම තහවුරු කර ඇත.

(d) පොළී අනුපාත අවදානම

සමාගම සතු මුදල් හා බැංකු ශේෂයන්වල රජයේ සුරක්ෂිත බැංකුවල පවතින තැන්පතු ඇතුළත්වේ. ප්‍රතිලාභ චක්‍රවල හැසිරීම සහ පොළී අනුපාත විචලනයන් ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොළී අනුපාත අවදානම පාලනය කල හැකිය.

(e) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම තුළින් අඛණ්ඩ පැවැත්මේ හැකියාව ආරාක්ෂා කරගැනීම වේ.

28. ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම්

පහත සඳහන් දෑ හැර සමාගමට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන කැපවීම සහ අවිනිශ්චිත වගකීම් නොමැත.

	රු.
- රඳවාගැනීමේ මුදල් - නව Jaw ක්‍රෂර 2 ක මත (කේෂර ඉංජිනියරින් (පුද්ගලික) සමාගම පිළියන්දල)	4,386,358.40

28.1 මූල්‍ය බැඳීම්

පහත සඳහන් කරුණු හැර වාර්තාකරණ දිනය අවසානයේ කිසිදු ප්‍රමාණාත්මක මූල්‍ය බැඳීමක් නොතිබුණි.

	රු.
විදුලි බිල්පත් ගෙවීම - 2024 මාර්තු	6,237,396.84
යන්ත්‍රෝපකරණ කුළියට ගැනීම – D.C.M. කන්ස්ට්‍රක්ෂන්ස් – මරදන්කඩවල	3,245,696.00
WPP බෑග් සැපයීම මත රඳවාගත් මුදල් - සෙන්ට්‍රල් පොලිසැක්	1,596,000.00
ආදායම් බදු ස්වයං තක්සේරු ගෙවීම 2022/23 – 4 කාර්තුව	13,358,858.00
නොගෙවූ WPP බෑග් පිරිවැය - ලංකා පොලිසැක් (පුද්ගලික) සමාගම	17,989,500.00
ගෙවිය යුතු රාජ්‍යභාගය - මාර්තු 2024 GSMB	18,696,254.36
නොගෙවූ WPP බෑග් පිරිවැය - සෙන්ට්‍රල් පොලිසැක් (පුද්ගලික) සමාගම	10,979,569.60
එකතු කළ අගය මත බදු ගෙවීම – මාර්තු 2024 දේ.ආ.දෙ.	14,655,386.91
මහවැලි අධිකාරියට ගෙවීම – ඉඩම් පරිහරණ ගාස්තු 2023/24	7,074,418.00
බනිජ බදු - ජනවාරි - මාර්තු 2024	1,170,949.03
කාර්ය මණ්ඩල අගය කිරීමේ දීමනාව	13,000,000.00
Wheelloder කුලියට ගැනීමේ ගාසිතු – මාර්තු 2024	1,386,950.00
මහා භාණ්ඩාගාරයට අතුරු ලාභාංශ	35,000,000.00
වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව හිඟ ඉඩම් පරිහරණ ගාස්තු 2016-2022	33,907,391.43
(නොගෙවූ) ඉඩම් බදු - වාරියපොළ ව්‍යාපෘතියේ ඉඩම සඳහා ගල්ලෑහේපිටියේ ප්‍රේමරතන හිමි (ජූනි 21 - සැප්තැම්බර් 22 දක්වා)	480,000.00

28.2 නීතිමය බැඳීම්

1. නීතිඥ සුනිල් වටවල මහතා විසින් ඔහුගේ සේවාදායකයින් වන එස්.අශෝක අබේසිරි සහ එස්.ඩී.රූපසිංහ යන අය සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 204/2023 (F/R) සහ 203/2023 (F/R) යන අයදුම්පත් ගොනු කර ඇත.

2. සෙන්ටර් ෆෝ එන්වයර්මන්ටල් ජස්ටිස් ගැරන්ටි ලිමිටඩ් සහ තවත් දෙදෙනෙකු විසින් රොක් පොස්පේට් අපනයනය කිරීම සඳහා නිකුත් කරන ලෙස කරන ලද 301/2023 (F/R) යන ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අයදුම්පත්‍රයක් ගොනු කර ඇත.

29. ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන

Ground Rock Phosphate සඳහා වන SLS 748 2014 පිරිවිතරයන්ට අනුකූල නොවන බව පෙනෙන එප්පාවල රොක් පොස්පේට් මෙ.ටො. 2500 තොගයක් සමාගම විසින් රඳවාගෙන ඇත. කෙසේවෙතත්, ඉහත තොගයෙන් මෙට්‍රික් ටොන් 1,743.37 ක් නැවත මිශ්‍ර කර වර්ෂය තුළ නිෂ්පාදන ක්‍රියාවලියට බාරදී ඇත. ඉතිරි කොටස් ප්‍රමිතිකරණය සිදුවෙමින් පවතී.

30. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

2023 මාර්තු 31 දිනට පාරිතෝෂික වගකීම්වල සත්‍ය තක්සේරුව
ගිණුම්කරණ හෙළිදරව් කිරීම් :

		රු.
නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ (PV-DBO) වර්තමාන අගය වෙනස්කිරීම		
2023 අප්‍රේල් 01 දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන	=	56,358,581
කාල සීමාව සඳහා පොළී පිරිවැය	=	9,017,373
අතීත සේවා පිරිවැය	=	4,272,746
කාලසීමාව සඳහා වත්මන් සේවා පිරිවැය	=	(6,319,320)
කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවූ/ගෙවිය යුතු පාරිතෝෂිකය	=	-
මාරු කල සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම්	=	-
PV-DBO මත සත්‍ය (ලාභ)/අලාභය	=	(2,964,332)
2024 මාර්තු 31 දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන	=	60,365,048
ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති මුදල්		
ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්		
2024 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	=	60,365,048
2024 මාර්තු 31 දිනට හඳුනා නොගත් සත්‍ය ගණන ලාභ/(අලාභ)	=	-
2024 මාර්තු 31 දිනට ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්	=	60,365,048
ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්		
පොළී පිරිවැය	=	9,017,373
වත්මන් සේවා පිරිවැය	=	4,272,746
ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්	=	13,290,119
වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වියදම්		
වහාම හඳුනාගත් ශුද්ධ සත්‍ය ගණන (ලාභ) / අලාභ	=	(2,964,332)
වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වියදම්	=	(2,964,332)

31 වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන කිසිදු තත්ත්වයක් උද්ගතවී නොමැත.

32 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

32.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ ගණුදෙනු

සමාගමේ කටයුතු සැළසුම් කිරීම මෙහෙයවීම හා පාලනය සඳහා බලය හා වගකීම ඇති පුද්ගලයින් සම්බන්ධිත පාර්ශවයන්ට අයත් වන අතර ඔවුන් සමාගමේ අධ්‍යක්ෂවරුන්වේ. වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයින්ට කල ගෙවීම් පහත පරිදි වේ.

	2023/2024	2022/2023
	රු.	රු.
කෙටිකාලීන ප්‍රතිලාභ	4,632,199	3,039,390

32.2 අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු කිරීම

මූල්‍ය වර්ෂය තුළ LKAS 24 යටතේ අර්ථ දක්වා ඇති සම්බන්ධිත පාර්ශවයන් ලෙස කිසිදු පාර්ශවයක් සහ ගණුදෙනු හඳුනාගෙන නොමැත.

ආයතනික තොරතුරු, සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

1. සංස්ථාපිත තොරතුරු

1.1 පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම යනු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සීමිත වගකීම් සහිත සමාගමකි. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් පරිවර්ථනය කරන ලදී.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14, නව කැළණි පාලම පාරේ, අංක 73 1/1 දරණ ස්ථානයෙහිද, පාෂාණමය පොස්පේට් (ඇපටයිට්) නිධිය එප්පාවලද පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම සිදු කිරීම, සකස් කිරීම, හා පාෂාණ අලෙවි කිරීමයි. මීට අමතරව සමාගම විසින් පොහොර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලියක් 2014 වර්ෂයේදී වාරියපොළ කනත්තේවැවදී ආරම්භ කරන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023.04.01 දින සිට 2024.03.31 දින දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය වාර්තා වලින් ආවරණය කරනු ලබයි.

1.4 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 මැයි මස අනුමැතිය දෙන ලදී.

2. පිලියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්වල සාරාංශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

2.2 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

- විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයමත මනිනු ලබයි.
- ආර්ථික ප්‍රතිලාභ බැඳියාවේ වගකීම වර්තමාන වටිනාකමට හඳුනා ගනී.
- සමාගමට ආදායම් උත්පාදනය සඳහා භාවිතා කරන ලද පොස්පේට් තැන්පතුවේ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිණුම් කිරීමට නොහැකි වූ බැවින් වත්කමක් වශයෙන් මූල්‍ය වාර්තාවල හඳුනාගෙන නොමැත.

2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස සමාගම ශ්‍රී ලංකා රුපියල් වලින් මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියලුම මුල්‍ය ප්‍රකාශන ආසන්නම රුපියලට වැටයූ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම – LKAS – 01 ට අනුව පෙර වර්ෂවල අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් අඛණ්ඩව සමාගම විසින් අනුගමනය කොට ඇත.

2.5 ප්‍රමාණාත්මකබව හා ඒකරාශි කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01) ප්‍රමිතියට අනුව සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මුල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හා ක්‍රියාකාරකම් සමාන නොවන අයිතමද ප්‍රමාණාත්මක නම්, වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මුල්‍ය වත්කම් හා මුල්‍ය වගකීම හිලව් කර ශුද්ධ වටිනාකම මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදුකල හැකියි. එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නිත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබීම. එහි ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් තිබීම. සමකාලීන ලෙස වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම. ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබාදෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හිලව් කිරීම කළ නොහැක.

.

3. විශේෂිතවූ ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තීරණාත්මක ගිණුම්කරණ උපකල්පනවල භාවිතය අවශ්‍යවේ. තවදුරටත්, සමාගමේ කළමනාකරණය විසින් වාර්තාකරණ කාලය අවසානයේදී අදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්වල අනාවරණය කිරීම්වල වටිනාකම් වාර්තා කිරීමට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇතිකර ගැනීමට අවශ්‍ය වේ. කෙසේ වුවද, උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අනාගත කාල පරිච්ඡේදය තුළ වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීම් කිරීමට සිදු වන ප්‍රතිඵල ලැබිය හැකිය. එම නිසා සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස්විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියේදී මුල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් හඳුනාගැනීම සඳහා වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන පහත සඳහන් විනිශ්චයන්, තක්සේරු හා උපකල්පන කළමනාකරණය විසින් ගනු ලබයි.

(අ) බදුකරණය

සමාගම අදායම් බදු සහ අනෙකුත් බදු වලට යටත්වේ. ප්‍රවර්ථන බද්ද, විලම්භීත බද්ද සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනයන් නිශ්චය කිරීමේදී ප්‍රමාණාත්මක විනිශ්චයන් අවශ්‍ය වන අතර, මේ සඳහා මුල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව අවශ්‍ය ගැලපීම් කිරීමේදී සහ බදු නිශ්චය කිරීම සඳහා බදු වන ලාභය ගණනය කිරීමේදී විසඳුම් ලැබීමට ඇති බදු නිර්දේශයන්ද අදාළ කරගත යුතුයි මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී අදාළ වන බදු නීතීන් හි අර්ථකතනයන් පිළිබඳව යම් යම් අවිනිශ්චිතතාවයන් පැවතිණි.

සමාගම වර්තමාන, විලම්භීත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනාගනුයේ අතිරේක බදු පවතීද යන තක්සේරුව මත වේ. අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මුලික සටහන් වලින් වෙනස්වීමේදී, එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම්, විලම්භීත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

(ආ) රාජ්‍යභාගය මුදල් ගෙවීම්

සමාගම විසින් ත්‍රෛමාසික පදනමින් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය වෙත කැණීම් කරන ලද නිමැවුමේ (කම්හල් නිෂ්පාදනය) එහි තීරණය කල වෙළඳපල වටිනාකමෙන් 7% ක් ගෙවීමට බැඳී සිටී. 2023/2024 වසර සඳහා මුළු මුදල රු.86,671,213.00 කි.

(ඇ) දේපළ හා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීමේ ක්‍රම සමාලෝචනය කරයි. කළමනාකරණයේ විනිශ්චය, මෙම අගයන්, අනුපාත, ක්‍රම තක්සේරු කිරීමේදී බලපාන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත්වේ.

(ඈ) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්න පිළිබඳවද සලකා බලයි.

- අමුද්‍රව්‍ය සැපයීම බාහිර කෙටි කාලීන ගිවිසුම් සහ අවිනිශ්චිත මූලාශ්‍ර මත රඳා පවතින අතර විකල්ප බනිජ නිධි හඳුනාගැනීම සඳහා පර්යේෂණ හා කැණීම් සිදු කර නොමැත.
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇස්තමේන්තු කර ඇත්තේ එප්පාවල සම්පූර්ණ නිධියේ රොක් පොස්පේට් මෙට්‍රික් ටොන් මිලියන 31 ක් ඇති බවයි.

කෙසේවෙතත්, පතල් කැණීමේ අයිතිය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් දීර්ඝකාලීන ගිවිසුමක් නොමැති බැවින් අනාගතයේදී පතල් කැණීම් කටයුතු සඳහා වෙනත් පාර්ශවයන්ද ඇතුළත් වීමේ හැකියාව පවතී. කෙසේවෙතත්, මේ වන විට එවැනි අවිනිශ්චිතතාවන් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය නොදකින අතර, එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ක්‍රියාත්මක වන පදනම මත සකස් කරනු ලැබේ.

(ඉ) ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

2024 මාර්තු 31 වන විට සමාගමේ ප්‍රතිඵල කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කල හැකි, ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

(ඊ) මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුල හානිකරණ අලාභ වාර්තා කිරීම සඳහා යම්කිසි හරයාත්මක සාක්ෂි පවතීද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් ඇගයීමක් සිදු කරයි.

(උ) විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට ලබා දී ණය හානිකරණය වී ඇතිද යන්න විමර්ශනය කරයි. සියලුම ණය සහ තැන්පතු සඳහා සමාන තක්සේරු ක්‍රියාවලියක් යොදාගත යුතුය.

(ඌ) විලම්භිත බදු වත්කම්

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකල බදු අලාභ සහ බදු බැර පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකිනම් පමණි. අනාගත බදු සැළසුම් කිරීමේ උපාය මාර්ග සමඟින් අනාගත බදු අය කල හැකි ලාභයේ විය හැකි කාලය සහ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි කල් දැමූ බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට සැළකිය යුතු කළමනාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

(එ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල ප්‍රමිත වටිනාකම ධාරණ අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සලකා බලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් ඇතුලත් කිරීම මෙයට ඇතුළත් වේ. මෙහි ඇතුලත් වනුයේ වට්ටම් අනුපාතවල නිර්ණය කිරීම්, අනාගත වැටුප් වැඩිකිරීම්, සේවක පිරිවැටුම් අනුපාතය යනාදියවේ. අගය කිරීමේ සංකීර්ණතාවය, පාදකවූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම උපකල්පන වල වෙනස්වීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකදී ඉතා සංවේදී වේ. සියළුම උපකල්පන සෑම වාර්තාකරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව බලාපොරොත්තුවන කාලයට යෝග්‍යවන තක්සේරු කරන කල්පිරීම සමග ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලබයි. සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත අනාගත වැටුප් වැඩිවීම තීරණය කරයි.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් යොදාගනු ලබන සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ. විශේෂයෙන් සඳහන් නොවන්නේ නම්, පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ව සියළුම කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදාගනු ලබයි.

4.1 ආදායම් හඳුනාගැනීම

4.1.1 භාණ්ඩ විකුණුම්

පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනාගනී.

- ගැණුම්කරුවන් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇතිවිට (ලිඛිතව, වාචිකව හෝ වෙනත් ව්‍යාපාර පිළිවෙත් වලට අනුකූලව) සහ ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට කැපවී සිටින අවස්ථාවක,
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේදී සෑම පාර්ශවයකම අයිතීන් හඳුනාගතහැකි අවස්ථාවක,
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේදී සෑම පාර්ශවයකම දුරු පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවක,
- ගිවිසුම වාණිජමය මුහුණුවරක් ගන්නා අවස්ථාවකදී,
- පාරිභෝගිකයා වෙත මාරු කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු වටිනාකම සමාගමට එකතුකර ගැනීමට ඉඩ ඇතිවිට.

4.1.2 පොළි ආදායම

ස්ථාවර තැන්පතු සහ REPO ආයෝජන වලින් ලැබෙන පොළී ආදායම සැබෑ පොළී අනුපාතය භාවිතා කරමින් උපචිත පදනම මත හඳුනාගැනේ. කෙසේවෙතත්, කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොළී ආදායම සිදුවූ විට සහ සැබෑ පදනම මත හඳුනාගැනේ.

4.1.3 ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ලාභාංශ ලද විට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල සැබෑ පදනම මතය (ශුද්ධ ආදායම).

4.1.4 වෙනත් ආදායම

වෙනත් ආදායම් ලද විට, සැබෑ පදනම මත හඳුනාගනු ලබයි.

4.2 වියදම් හඳුනාගැනීම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධයක් මතය. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරන කාර්‍යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන සියලුම වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් අයකරනු ලැබේ.

ව්‍යාපාරය කරගෙන යාමේදී ඇතිවන සියලුම වියදම් සහ දේපළ, පිරියත උපකරණ ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම තුල ඇතිවන අයකර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණුනින්, සමාගමේ කාර්‍යසාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් ශ්‍රිත" ක්‍රමය පවත්වාගෙන යයි. ආදායම් බදු වියදම් තුළ ජංගම හා විලම්භීත බදු ඇතුලත්වේ. ආදායම් බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

4.3 බදු

4.3.1 ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුල ප්‍රවර්ථන වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාලගෙන් අයවියයුතු හෝ ගෙවියයුතු සහ පෙර වසර සඳහා ගැලපීමක් සිදු කළ යුතු නම් එය ඇතුළත් වේ. වාර්තාකරණ දිනට නිතීගත කර ඇති හෝ ඊට පසුව නීතිගත කර ඇති බදු නීති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

4.3.2 විලම්භීත බදු

විලම්භීත බදු පනවනු ලබන්නේ මුල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදාගනිමිනි.

සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භීත බදු වත්කම් හඳුනාගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙනයාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අයකල හැකි ලාභයට එරෙහිව ලබාගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ හා භාවිතයට නොගත් බදු ගෙවීම් භාවිතා කල හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භීත බදු වත්කමේ ධාරණ අගය විමර්ශනය කරනු ලබන අතර, විලම්භීත බදු වත්කමේ මුල් අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයෙන් තවදුරටත් යම් ප්‍රමාණයක් දක්වා අඩුකරනු ලබයි. හඳුනා නොගත් විලම්භීත බදු වත්කම් සෑම මුල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයකම නැවත අගය කරනු ලබන අතර, අනාගත බදු අයකළ හැකි ලාභය, විලම්භීත බදු වත්කම ආවරණය කර ගැනීමට ඉඩදේ නම්, තවදුරටත් යම් ප්‍රමාණයකට හඳුනාගත හැකිය. විලම්භීත බදු වත්කම් හා වගකීම්, නීතිගත කරන ලද හෝ පසුකාලිනව නීතිගත කරන ලද, බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හඳුනාගැනීම හෝ වගකීම් නිරාකරණය කරගත් විට, වර්ෂය තුළ යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.

විලම්භීත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වත්කම් සාක්ෂාත් කරගත් හෝ වගකීම් පියවන වර්ෂයේ අදාළවීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අනුව, බදු අනුපාත සහ වාර්තාකරන දිනයේ පනවන ලද හෝ පසුව පනවන ලද බදු නීති මත පදනම්වය.

4.4 මූල්‍ය නොවන වත්කම

4.4.1 දේපළ, පිරියත සහ උපකරණ

හඳුනාගැනීම සහ මැනීම

වත්කම් ආශ්‍රිතව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ ප්‍රවණතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව විශ්වාසදායීව මැනිය හැකිවිට දේපළ සහ උපකරණ හඳුනාගනු ලබයි. මූලිකවම දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට මිණුම් කරයි.

පිරිවැය ආකෘතිය

දේපළ සහ උපකරණ දෛනික සේවා පිරිවැයන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කරනු ලබයි. හදුනාගන්නා ලද උපමානයන් හමුවුනහොත් ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය දුරුවිට එම පිරිවැය තුළ ඇතුලත් කරයි.

පසුකාලින පිරිවැය

පසුකාලින පිරිවැය ඇතිවනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ වත්කම් ඉපැයීමේ හැකියාව වර්ධනය කිරීමේ අදහසින් පසුකාලීනව දරන ලද ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම්, දිර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම් වන අතර, මේවා ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ හඳුනාගනී. දේපළ, පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනියි.

ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය භාවිතා කොට දේපළ සහ උපකරණ වල පිරිවැය සුන්බුන් අගය දක්වා ඵලදායි ජීවිතකාලය පුරා ලියා හරිමින් ක්ෂයවීම් ගණනය කරයි. මිලදී ගැනීමේ දිනයේ සිට අත්තිකාරම් පදනම මත ඉවත් කිරීම දක්වා ක්ෂය වීම සිදුකරයි. ඉඩම් ක්ෂය නොකරයි.
තක්සේරු කරන ලද ඵලදායී ජීවිත කාලය මත ක්ෂය අනුපාත පහත දැක්වේ.

වත්කම් වර්ගය	ක්ෂය ප්‍රතිශතය (%)
ගොඩනැගිලි	04
යන්ත්‍ර, පිරියත හා විදුලි උපකරණ සහ රසායනාගාර උපකරණ	10
මෝටර් වාහන	20
කාර්යාල උපකරණ	20
ලීබඩු හා සවිකිරීම්	20
විදුලි අලි වැට	20
පරිගණක දෘඩාංග හා මෘදුකාංග	20
ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම	05

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිතාකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය සළකා බලන අතර ඒ සඳහා සංශෝධනයක් අවශ්‍ය නම් සිදුකරනු ලබයි. තාක්ෂණික වෙනස්වීමක් මත හෝ වෙනයම් හේතුවක් මත කිසියම් වත්කමක වටිනාකම සැළකිය යුතු ලෙස වෙන්වුනි නම් අදාළ අයිතමයේ ස්වභාවය හා වටිනාකම මත ක්ෂය කිරීම ගැලපෙන අනුපාතයට සිදුකිරීම හෝ සමාගමේ ලාභයට එරෙහිව කපාහැරීම සිදුකළ යුතුයි. (උදා : ජංගම දුරකථන, කැමරා)

වත්කමක වටිනාකම රු. 5,000 ක් ඉක්මවන්නේ නම් එය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කමක් ලෙස සළකයි. රු.5,000 කට අඩු වත්කම් ප්‍රමාණාත්මක නොවන ලෙස සළකන අතර, ලාභයට එරෙහිව කපාහරිනු ලැබේ. අනාගතයේදී සත්‍යාගණනය සඳහා අදාළ දෙපාර්තමේන්තු මගින් ලේඛනයක් පවත්වාගෙන යයි.

ප්‍රති හඳුනා ගැනීම

දේපළ, පිරියත හා උපකරණ භාවිතා කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හඳුනා නොගනී. වත්කම් ප්‍රති හඳුනා ගැනීම මත ඇති වන ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරයි) වත්කම් ප්‍රති හඳුනා ගැනීම වර්ෂය තුළ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනයේ “වෙනත් මෙහෙයුම් ආදායම්” යටතේ හඳුනාගනු ලබයි.

4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම එහි වත්කම්හි හානිකරණය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳ විවරණයක් සිදු කරයි. කිසියම් ඇඟවීමක් පවතින්නේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍යවන විට, සමාගම විසින් වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

4.5 මෙහෙයුම් කල්බදු

කල්බදු හිමියා විසින් කල්බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලීන අවදානම් ඵලදායීව රඳවා ගනී නම් එවැනි බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල්බදු ගෙවීම කල්බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හඳුනාගැනීම හෝ කල්බදු වත්කම් භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලාඑන කාල පිළිවෙලේ නිරූපණය මත හඳුනාගනු ලබයි.

4.6 තොග

සාමාන්‍ය තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධික අගය යන අගයන් වලින් අඩු අගයට ප්‍රකාශ කරයි. නිෂ්පාදන පිරිවැය මත පදනම්ව හරිත සාමාන්‍ය පදනම මත පිරිවැය හඳුනාගනී. පොස්පේට් තොග අගය කරන විට කැනීම් පිරිවැයෙන් 40% ක් ඇඹරුම් (සකස් නොකළ) නිෂ්පාදනයටද ඉතිරි 60% සකස් කළ නිෂ්පාදනයටද විභජනය කිරීම භාවිතයේ පවතී. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ පිරිවැය උපලබ්ධි කිරීම සඳහා අවසර දීමෙන් පසුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට තබා ඇති තොගවල මිල ගණන් අනුවය. යල්පැනගිය, මන්ද සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන්කිරීම් සිදුකරනු ලබයි.

4.7 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීම

ප්‍රවර්ථන වර්ෂය තුළදී ක්‍රමක්ෂය පදනම මත හඳුනාගත් මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය හෝ ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය පහත පදනම් දේ මත වර්ග කරනු ලබයි.

අ) මූල්‍ය සහකාර කළමනාකරණය සඳහා සමාගමේ ව්‍යාපාරික ආකෘතිය

ආ) මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

පහත කොන්දේසි දෙකම සපිරේ නම් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පදනම හඳුනාගත හැකිය,

අ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්,

ආ. මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු ලබන පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්,

පහත කොන්දේසි දෙකම සැපිරේ නම්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් හඳුනාගන්නා සාධාරණ අගයට මූල්‍ය වත්කම් මනිනු ලබයි.

(අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීමේ අරමුණෙන් ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්

(ආ) මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්,

4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ හඳුනාගනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු ශේෂ වශයෙන්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වල, අතැති මුදල් සහ බැංකු අයිරාවේ නොගෙවූ ශුද්ධ අගය අඩු කල පසු බැංකු තැන්පතු අන්තර්ගත වේ. වර්තමාන වෙළඳපොල අර්බුදය හේතුකොටගෙන සමාගම ලංකා බැංකු ග්‍රෑන්ප්පාස් ශාඛාව වෙතින් රු.මිලියන 70 ක් ස්ථීර බැංකු අයිරා පහසුකම් ලබාගෙන ඇත. කෙසේවෙතත්, 2024 මාර්තු 31 වන විට භාවිතා කල මුදල ශූන්‍යව පැවතිණි.

4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, හිමිකම් ලෙස වර්ගකරයි. හිමිකම් සාධන පත්‍ර, මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් වත්කම් ලැබීම හෝ ලැබිය යුතු දෑ, හිමිකම් සාධන පත්‍ර නිකුත්කිරීමේ සෘජු ශුද්ධ පිරිවැයට මනිනු ලබයි.

4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව

4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

සමාගම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී. පාරිතෝෂිකය ගෙවීමට ඇති වගකීම් අනුව අඛණ්ඩව අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ විය යුතුය. එම පනත යටතේ සමාගමේ වගකීම නිවැරදි උපකල්පන මත ගොඩනැගූ සුත්‍රය (ප්‍රක්ෂිප්ත) මත පදනම් වේ. උපකල්පන හා ක්‍රමවේදය මත ගණනය කල සේවකයින්ගේ 2024 මාර්තු 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව මත වූ වර්තමාන අගය රු.60,365,049/-කි. එමෙන්ම විශ්‍රාම ප්‍රතිලාභ මත වූ වර්තමාන අගය 2023 මාර්තු 31 දිනට රු. 56,358,582/- ක් විය. එම වගකීම බාහිර අරමුදලක් ලෙස ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ ස්ථාවර තැන්පතුවක් ලෙස පවතී. වර්ෂ අවසාන වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රුපියල් 125,376,000/- (0089022357) කි. එක් එක් වර්ෂය අවසානයේ දී තීරණය කරන ලද වගකීම් මත වාර්ෂිකව ආයෝජනය කරනු ලබන මුදල වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

4.10.2 නිශ්චිත දායක සැලසුම

නිශ්චිත දායක සැලසුමක් යනු වෙනමම ඒකකයක් තුල ස්ථීර දායකයක් ගෙවන සහ අමතර වටිනාකම් ගෙවීමට නීතිමය හෝ නිර්මාණාත්මක බැඳියාවක් නොමැති පසු සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායක සැලසුම් දායකත්වය සඳහා බැඳියාව හඳුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලයතුල, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

(අ) සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය 12% සහ 10% වශයෙන් වේ.

(ආ) සේවක භාරකාර අරමුදල

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප් මත 3% ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

4.11 මූල්‍ය වගකීම්

පහත සඳහන් අ සහ ආ හැර සමාගම සියලු මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂය කල පිරිවැයෙන් මනින පරිදි වර්ගීකරණය කරයි.

(අ) ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්

(ආ) මූල්‍ය වත්කම් මාරුවක් හඳුනා ගැනීම සඳහා සුදුසුකම් නොලබන විට හෝ අඛණ්ඩව සම්බන්ධවීමේ ප්‍රවේශය අදාළ වන විට පැන නගින මූල්‍ය වගකීම්.

4.12 වෙන් කිරීම් ප්‍රතිපාදන

වෙන්කිරීම් හදුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳියාවක් (නීතිමය හෝ නිර්මාණාත්මක) පවතින විට සහ බැඳියාව නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් පවතින හා බැඳීම විශ්වාසදායකව මැනිය හැකි විටදීය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රතිපුර්ණයන් අඩු කළ පසු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරයි.

4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKAS 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය, යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගනිමින් සකස් කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල්, බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

4.14 ආංශික තොරතුරු

අංශයක්/බණ්ඩයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන හදුනාගත හැකි අංශයක් වන අතර වෙනත් අංශයන්ගෙන් වෙනස්වූ අවධානම් සහ ප්‍රතිලාභවලට හිමිකම් ලබයි. සියළු මෙහෙයුම් එක් කණ්ඩයක් ලෙස සලකනු ලබන බැවින්, සමාගමට වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඇති අංශයන්/බන්ඩයන් නොමැත.

රැස්වීම් පිළිබඳ දැනුම්දීම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2024 දෙසැම්බර් මස ..... වන දින පස්වරු 3.00 ට කොළඹ 14, නව කැළණිපාලම පාර, අංක 73 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

1. 2023 දෙසැම්බර් මස 19 පැවති වාර්ෂික මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තා අනුමත කිරීම.

2. 2024.03.31 න් අවසන් වූ වසර සඳහා විගණනය කල ගිණුම් ප්‍රකාශය හා 2024.03.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය හා විගණකාධිපති වාර්තාව මෙහි සඳහන් කර ඇත.

3. මේ සමඟ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීම සහ අනුමත කිරීම.

4. මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස 2023/2024 වර්ෂය සඳහා ලාභාංශ බෙදා හැරීම අනුමත කිරීම.

5. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 සහ 93 වන වගන්ති ප්‍රකාරව (වාර්ෂික මහා සභා රැස්වීමේදී) විශ්‍රාම යන අධ්‍යක්ෂකවරුන් සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 94 වන වගන්තිය යටතේ නැවත තේරී පත්වීම.

6. 2024/2025 වර්ෂය සඳහා විගණක ලෙස විගණකාධිපතිවරයා ප්‍රකාශයට පත්කිරීම.

7. දැනුම්දී ඇත අනෙකුත් දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,
කල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විස් (පුද්ගලික) සමාගම
සී/ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරුන්

සටහන්

මහා සභා රැස්වීමේදී කොටස්කරුවෙකුට ඔහු වෙනුවෙන් ඡන්දය දීමට, ඔහු/ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම් තිබේ. ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත.

පෙරකලාසියේ ආකෘතිය

සී/ස ලංකා පොස්පේට් සමාගම

බ ල ප ත්‍ර ය

.....පදිංචි.....වන, මම/අපි ඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් ..... පදිංචි ..... හෝ ඔහු/ඇය අසමත් වුවහොත් ..... පදිංචි ..... යන අය මගේ/අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2024 දෙසැම්බර් මස ..... වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ යම් කල් තැබීමකදීද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම, අප/මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

2024 ..... මස ..... දිනයේදී අත්සන් කරන ලදී.

අත්සන ……..

සටහන

- නියෝජිතයාට ඔහුට සුදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට ගෙනෙන ලද ඕනෑම යෝජනාවකට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය.
- නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකුවීම අවශ්‍ය නැත.
- සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.